# බළන්ගොඩ නගර සභාව

## 2026.05.12 දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2026.05.12**

**වේලාව -පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | එන්.ඩබ්.පී.ටී ජයසේන මැතිතුමා |
| 2.ගරු උප සභාපති | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම් රූමි මැතිතුමා |
| 5.ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6.ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7.ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී පේමදාස මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 9.ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ.එස් චන්දන මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | එස්.යූ.සී ජයනක මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

**01.පසුගිය 2026.04.07 දිනැති මහ සභාවේ සභා වාර්තාව සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු සභාපතිතුමා, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගන්නා ලදී.

ඉන් අනතුරුව න්‍යායපත්‍රානුකූලව 2026-04-07 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් 2026-04-07 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තා බවට යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදිශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමන් සංශෝධන ඉදිරිපත් කරන ලෙස දැන්වූ අතර සංශෝධන කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2026-04-07 දිනැති මහ සභා වාර්තාව ගරු සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ❖ නිවේදන වාරය ආරම්භ කරමින් ගරු සභාපතිතුමා, 2026 වර්ෂයේ ජාතික වෙසක් සතිය සම්බන්ධයෙන් ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් චක්‍රලේඛයක් නිකුත් කර ඇති බවත්, ඒ අනුව 2026 වර්ෂයේ ජාතික වෙසක් සතිය 2026.05.27 දින සිට 2026.06.02 දින දක්වා විවිධ වැඩසටහන් පවත්වමින් සැමරීම සඳහා ස්වදේශ කටයුතු චක්‍රලේඛ මගින් වැඩසටහන් යෝජනාවලියක් ඉදිරිපත් කර ඇති බවත්, ඒ යටතේ බලන්ගොඩ නගර සභාව ලෙස වැඩපිළිවෙලක් සකස් කර ඇති බවත් ඒ අනුව ඉදිරියේදී ඒ සම්බන්ධයෙන් සියලු දෙනා දැනුවත් කරන බවත් පවසන ලදී.

- ❖ මෙහිදී ගරු සභාපතිතුමා මෙය විශේෂ ස්තූතියක් සිදු කිරීමට අවස්ථාවක් කරගන්නා බවත්, බළන්ගොඩ නගර සභාවේ කාර්ය මණ්ඩලය, සුභසාධක සංගමය එකතු වී පසුගිය මැයි මස 02 වෙනිදා අවුරුදු උත්සවයක් පඹහින්න 'Heritage' ආයතනයේදී පැවැත්වූ බවත්, ඉතා උත්කර්ෂවත් අයුරින් කාර්ය මණ්ඩලය සහ මන්ත්‍රී මණ්ඩලය, විශේෂයෙන් හිටපු සභාපති වසන්ත ගුණරත්න මන්ත්‍රීතුමා, ඒ වගේම සුනේත්‍රා මන්ත්‍රීතුමිය, නිමල් මන්ත්‍රීතුමා, උප සභාපතිතුමා, ජයනක මන්ත්‍රීතුමා, වසන්ත කුමාර මන්ත්‍රීතුමා, සිසිල මන්ත්‍රීතුමා, නදීක මන්ත්‍රීතුමා ඇතුළු කණ්ඩායම එකතු වී දවසක් පුරා මේ අවුරුදු උත්සවය පැවැත්වූ බවත්, එයට සහභාගී වීම සම්බන්ධයෙන් එමෙන්ම විවිධ ආයතන විසින් ඒ සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන

සහ තෑගි ලබාදීම් සිදු කිරීම සම්බන්ධයෙන් ඒ ආයතන සියල්ලටමත් ස්තූතිවන්ත වන බවත් පවසන ලදී.

- 2026.03.30 දින බළන්ගොඩ නගර සභා ශ්‍රවණාගාරයේදී කසළ කළමණාකරණ කටයුතු වල නියුතු සේවක මහත්ම මහත්මීන් හට කසළ කළමණාකරණය සම්බන්ධයෙන් පුහුණු වැඩසටහනක් පැවැත්වීම හා ඊට සම්පත් දායකත්වය ලබාදුන් මහජන සෞඛ්‍ය පරීක්ෂක ඒ.පී.අසංක ප්‍රියන්ජන ගුණරත්න මහතාට බෙහෙවින් ස්තූතිවන්ත වන බවත්, එම වැඩසටහන සාර්ථක කර ගැනීමට සහයෝගය ලබාදුන් බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිතුමා, ලේකම්තුමිය ඇතුළු කාර්යමණ්ඩලයට ස්තූතිය පුද කරන බවත් දන්වමින් බළන්ගොඩ ප්‍රාදේශීය සභාව යොමුකර ඇති ලිපිය ගරු සභාපතිතුමන් සභාගත කරන ලදී.

**03. සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා**

අසනීප තත්ත්වයක් හේතුවෙන් ගරු නාගරික මන්ත්‍රීනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය 2026-05-12 දින මහ සභාවට සහභාගී නොවන බවත්, නිවාඩු අනුමත කර දෙන ලෙසත් යොමු කරන ලද ඉල්ලීම අනුව ගරු සභාපතිතුමන් විසින් එතුමියගේ නිවාඩු අනුමත කරන ලෙසට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.ඒ අනුව එකී නිවාඩු ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04. සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් කිරීම.**

මෙදින ගරු සභාවේ සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා ඉදිරිපත් කිරීම් නොවන බව ගරු සභාපතිතුමා පවසන ලදී.

**05.ටෙන්ඩර්පත් හා මිල ගණන් විවෘත කිරීම.**

මෙදිනට නියමිත ටෙන්ඩර්පත් විවෘත කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාවක් බවට පත්කරන ලදී. අනතුරුව ටෙන්ඩර් මණ්ඩලය විසින් ගනු ලැබූ පහත සඳහන් තීරණ ගරු සභාපතිතුමන් විසින් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

**05:01** බළන්ගොඩ නගර සභාවට අයත් සම්පත් සම්පත් පියස කඩකාමර අංක 01,02,03,සහ 04 යන කඩ කාමර 2026.05.12 වන දින සිට 2027.05.11 දින දක්වා බදුදීමට සුදුසු බදුකරුවන් තෝරා ගැනීම් සඳහා ටෙන්ඩර්පත් කැඳවීම.

බළන්ගොඩ නගර සභාවට අයත් සම්පත් සම්පත් පියස කඩකාමර අංක 01,02,03,සහ 04 යන කඩ කාමර 2026.05.12 වන දින සිට 2027.05.11 දින දක්වා බදුදීමට සුදුසු බදුකරුවන් තෝරා ගැනීම් සඳහා ටෙන්ඩර්පත් කැඳවීමට අදාළව නිකුත්ව තිබූ අයදුම්පත්‍ර 49 ක් ලැබී තිබිණි.

සම්පත් පිරිස කඩකාමර අංක 01 සඳහා නිකුත් කර තිබූ අයදුම්පත් අතුරින් විජේසේකර කංකා නම්ලාගේ හර්ෂණී  නිසංසලා විජේසේකර මිය රුපියල් 25000ක ලංසුවක් ඉදිරිපත් කර තිබූ අතර එම කඩ කාමරය සඳහා ඉදිරිපත් වූ වැඩිම ලංසු මුදල එය වූ බැවින් ඇයට එම ලංසු මුදලට කඩ කාමරය ලබාදීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලද අතර එම මහත්මිය විසින් එකඟතාවය පළ කරන ලදී.

සම්පත් පියස කඩ කාමර අංක 02 සඳහා වැඩිම ලංසු මුදල ඉදිරිපත් කර තිබුණේ කිරිය කට්ටඩියලාගේ තීක්ෂණ ජීවන්ත ලක්මල් මහතා විසිනි . එම ලංසුව රු. 23000 ක් වූ අතර තීක්ෂණ මහතා එම ලංසුව බාරගැනීමට එකඟතාවයේ පළ කරන ලද අතර ඔහුට එම කඩ කාමරය ලබාදීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

සම්පත් පියස කඩ කාමර අංක 03 සඳහා වැඩිම ලංසුව ඉදිරිපත් කර තිබුණේ චාමර ජීවන්ත රත්නසිරි මයා විසිනි. එම ලංසු රු. 23100 ක් වූ අතර එම මහතා එම ලංසුව භාර ගැනීමට එකඟතාවය පළ කරන ලදී. ඒ අනුව ඔහුට එහෙම කඩ කාමරය ලබාදීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

සම්පත් පියස කඩ කාමර අංක 04 සඳහා වැඩිම ලංසුව ආකාශ් සඳරු නිලුමින්ද ශ්‍රී වීරසිංහ මහතා විසින් ඉදිරිපත් කර තිබූ අතර ලංසුව රු.16650 ක් විය. එම ලංසුව භාරගැනීමට එම මහතා විසින් එකඟතාවය පළ කරන ලද අතර ඔහුට එම කඩ කාමරය ලබාදීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදී.

ඉහත  ඉදිරිපත් කළ ලංසු අතරින් ලංසුපත් අසම්පූර්ණ ලෙස ඉදිරිපත්වීම නිසා අයදුම්කරුවන්ගේ එම ලංසුපත් තුනක් ටෙන්ඩර්මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

ටෙන්ඩර් මණ්ඩලය විසින් ගන්නා ලද ඉහත ටෙන්ඩර් මණ්ඩල තීරණ ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කළ අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**06.** **කල් දී ඇති ප්‍රශ්න**

**06:01 ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා**

**06:01:01** 2026 වර්ෂයට වෙන් කරන ලද ප්‍රාග්ධන වියදම්වල ඉතිරි මුදල කොපමණද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසුයේ ප්‍රාග්ධන වියදම් සඳහා 2026 වර්ෂයේ අයවැය වාර්තාවේ ඇස්තමේන්තුගත මුදල ලෙස රු.26,035,000.00 ක් පවතින බවත්,දැනට 2026.05.11 දිනට ඉතිරි මුදල ලෙස රු.23,067,783.57 ක් පවතින බවත්,නමුත් මෙම මුදල් අතේ තියෙන මුදල් නොවන බවත්, ඇස්තමේන්තු කළ මුදල්වලින් ඉතිරි ප්‍රමාණය බවත්ය.

**06:01:02** 2026 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන මත ලබාදුන් යෝජනා ක්‍රියාත්මක කරන දිනය කවදාද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසුයේ 2026 අයවැය මඟින් මන්ත්‍රීවරයෙකුට රු.ලක්ෂ පහ බැගින් ප්‍රතිපාදන වෙන් කළ බවත්, දැනට පවතින මුදල් තත්ත්වය සලකා බලා, මසකට යෝජනාවලින් දෙකක් පමණ ක්‍රියාත්මක කළ හැකි බවට අදහස් කරන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.ඒ හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ මසකට යෝජනා දෙකක් පමණක් ක්‍රියාත්මක කරන්නේ නම් තව ඉතිරිව ඇත්තේ මාස 7ක් පමණක් බැවින් මන්ත්‍රී යෝජනා 16ම ක්‍රියාත්මක කළ නොහැකි වන බවයි.ගරු සභාපතිතුමා පැවසුයේ ලැබෙන මුදල් අනුව සමහර මාසවල තුනක් වුවද ක්‍රියාත්මක කළ හැකි බවයි.

**06:02 ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා**

**06:02:01** මා විසින් 2025.07.14 දින සිට 2026.04.07 දින දක්වා කර්මාන්ත කමිටුව වෙත යෝජනා කළ කර්මාන්ත කවරේද?එමඟින් නිම කර දී ඇති කර්මාන්ත මොනවාද?ඉතිරිව ඇති කර්මාන්ත මොනවාද?ඒවා නිම කර දෙන්නේ කවදාද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසුයේ එතුමා පහත පරිදි කර්මාන්ත කාරක සභාව වෙත යෝජනා හතරක් ඉදිරිපත් කර ඇති බවත්, දැනට තත්ත්වය අනුව මේ හතරෙන් එකක්වත් ක්‍රියාත්මක වී නොමැති බවත්, නමුත් සභාව තුළ යෝජනා වූ කර්මාන්ත ක්‍රියාත්මක වී ඇති බවත්ය.

1. බෝම්බුව/ පහළ මස්සැන්න මාර්ගය අලුත්වැඩියා කිරීම.
2. කොටුගොඩැල්ල සිට ගුලන හන්දිය දක්වා යා කෙරෙන මාර්ගයේ ඉතිරි කොටස නිම කිරීම.

3. උඩකන්ද සුසාන භූමියට පිවිසෙන මාර්ගය සඳහා කොන්ක්‍රීට් කිරීම හෝ තාර දැමීම.
4. බෝම්බුව පරගහකුඹුර ගිලා බසින ස්ථානයට පැති බැම්මක් ඉදිකිරීම.

**06:03 ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

**06:03:01** පසුගිය 2025 වසර සඳහා දෙනු ලැබූ මන්ත්‍රී ප්‍රතිපාදන රු.75,000 ප්‍රතිපාදන වලට මොකද වුනේ?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා මන්ත්‍රී ප්‍රතිපාදනවලින් සෘජුවම වියදම් කළ හැකි ව්‍යාපෘති ක්‍රියාත්මක වූ බවත්, 'සෝලා' ව්‍යාපෘති, ජල යෝජනා ක්‍රම වැනි යෝජනා ක්‍රියාත්මක වී ඇති බවත්, අනෙකුත් යෝජනා සඳහා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය යටතේ සිදු කළ යුතු බැවින් අනුමැතිය ඉල්ලීම් කර ලිපි යැවූ බවත්, වසන්ත මන්ත්‍රීතුමාගේ මිහිඳු පෙරහැර සඳහා මුදල් දායකත්වය ලබාදෙන යෝජනාව සඳහා පෙරහැර කමිටුවෙන් ඉල්ලීම් ලිපිය ලැබී ඇති බවත්, වැඩිහිටි සමිතියකට උපකරණ දීමට අදාළ සභා තීරණය යොමු කරන ලෙස දන්වා තිබූ බවත්, කිව්ලෙවෙල නිවාස ආධාර ලබා දීමේ යෝජනා දෙක සඳහා ප්‍රාදේශීය ලේකම්ගෙන් තොරතුරු ඉල්ලා ඇති බවත්, එයින් වෙනත් ආධාර ලැබී තිබේද යන්න සලකා බැලීම සිදුවන බවත්, ඒ සඳහා නිශ්චිත පිළිතුරක් තවම ලැබී නොමැති බවත් පවසන ලදී.

නමුත් මෙම අවස්ථාවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉහත ලිපි ලැබෙන තෙක් පෙරහැර සඳහා මුදල් හදිසි බැවින් සහ එම පෙරහැර කමිටු ලිපිය ලැබී ඇති බැවින් එම යෝජනාව සඳහා ප්‍රමුඛතාව ලබා දීම සුදුසු බව ගරු සභාපතිතුමා පවසන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා එතුමාගේ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ලබාදුන් නිවාස අධාර ලබා දීමේ යෝජනාව පිළිබඳව විමසන ලදුව ගරු සභාපතිතුමන් පැවසූයේ ඒ සඳහාද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අදාළ ලිපි ලැබිය යුතු බවයි.අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා පැවසූයේ එලෙස ලිපි ලැබිය යුත්තේ හානි වූ නිවාස වලට බවත්, තමන් යෝජනා කරන ලද්දේ අර්ධ නිමකල නිවාස සඳහා ආධාරයක් බවත්ය.

මෙහිදී ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සඳහන් කලේ ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් වන්දන මැතිතුමා ඉදිරිපත් කරන ලද දිට්වා සුළි කුණාටුව හේතුවෙන් විනාශ වූ කිව්ලවෙල නිවසක් සඳහා ආධාර ලබා දීමේ යෝජනාව සඳහා වෙනත් ආධාර ලැබී නොමැති බවට ප්‍රාදේශීය ලේකම් තහවුරුවක් අවශ්‍ය බවත්,එය තවම ලැබී නොමැති බවත්, ඉහත ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමාගේ යෝජනාව එසේ හානි වූ නිවසක් සඳහා නොවන බවත් දෙවන

වර අනුමැතිය සඳහා යොමුකළ ලිපි බවත්, මේ සඳහා පිළිතුරු යැවීමට ප්‍රමාද වී ඇත්තේ පෙරහැර කමිටුව ලිපිය සහ ප්‍රාදේශීය ලේකම්ගේ තහවුරු ලිපි ප්‍රමාදය හේතුවෙන් බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය එතුමියගේ මන්ත්‍රී ප්‍රතිපාදන යෝජනාව නැවතත් ඉදිරිපත් කළ යුතුද යන්න විමසන ලදුව ගරු සභාපතිතුමන් පැවසුයේ ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට ඉදිරිපත් කළ ලිපියට පිළිතුරු ලිපියේ සහා තීරණය පිළිබඳව විමසා ඇති බවයි.

**06:03:02** 2026 මන්ත්‍රී ප්‍රතිපාදන ලක්ෂ පහ සඳහා වැඩකිරීමට මේ වන විට හැකියාව ඇත්ද?

ගරු සභාපතිතුමන් පැවසූයේ ඉහත කල් දී ඇති ප්‍රශ්න 06:01:02 යටතේ මේ සඳහා පිළිතුරු ලබා දුන් බවයි.

**06:03:03** පසුගිය සභාවේදී මා විසින් යෝජනා කළ බළන්ගොඩ රෝහලේ වැසිකිළිවල දොරවල් පිළිබඳ දැන් තත්වය කෙසේද?සම්බන්ධීකරණ කමිටුවට දැනුම් දුන්නද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසූයේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා සමඟ ඒ සම්බන්ධයෙන් රෝහලේ විශේෂ නිරීක්ෂණයක යෙදුන බවත්, වැසිකිළි දොරවල් පමණක් නොව තවත් අඩුපාඩු රැසක් පවතින බවත්, පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ඒ අඩුපාඩු ටික සකස් කිරීමට එහිදී සාකච්ඡා කරගත් බවත්, ඒ සම්බන්ධව වාර්තාව අරගෙන එම කටයුතු ඉක්මනින් නිම කරන්න ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා මැදිහත් වන බවත්, රෝහලේ නිලධාරීන් සමඟත් මේ සම්බන්ධව සාකච්ඡා කළ බවත්ය.

**06:04 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා**

**06:04:01** 2025 වර්ෂයේ වෙන්වූ රු.75,000 මුදල බළන්ගොඩ පැවැත්වෙන මිහිඳු උත්සවයට ලබාදීමට ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලැබී ඇත්ද?

ගරු සභාපතිතුමන් පැවසූයේ ඉහත ප්‍රශ්නයටද ඉහත සාකච්ඡාවේදී කරුණු පැහැදිලි කළ බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා සඳහන් කලේ පෙරහැරට ලබාදෙන මුදල් පිළිබඳව කතා කිරීමට අවශ්‍ය බවත්, යෝජනාව අනුමැතියට ඉදිරිපත් කර අවුරුද්දකට කිට්ටු වන බවත්, පෙරහැර කමිටුවෙන් ඉල්ලීම් ලිපියක් නැහැ කියලා දැන් කියනවා සති එකහමාරකට කලින් බවත්, එතකොට ඒක ලොකු ප්‍රමාදයක් බවත්, ඒක එහෙම වෙන්න බැරි බවත්,සාමාන්‍යයෙන් තමාගේ කාලේ තමන් ආණ්ඩුකාරතුමාට හරි ලේකම්තුමාට හරි ඉල්ලීමක් කළාම ඒක ගැන හොයලා බලලා තීන්දුවක් ගන්නා බවත්,

සභාපතිතුමා හරි ලේකම්තුමිය හරි එතනට ගිහිල්ලා මේ ලිපියට මොකද වුණේ කියලා හොයන්න ඕනි බවත්, පසු විපරමක් පැවතිය යුතු බවත්, පෙරහැරට තව තියෙන්නේ කොච්චර කාලයක්ද යන්නත්, මෙය ලැබෙනවාද නැද්ද යන්න පිළිබඳව දැනගත යුතු බවත්, දායක සභාව බලන් ඉන්නවා, හාමුදුරුවෝ බලන් ඉන්නවා ඒ නිසා මේක ඉක්මන් කරන්න යන්නත්ය.

ගරු සභාපතිතුමා පැවසූයේ පෙරහැර කමිටුව පවත්වා ඇත්තේ පසුගිය සතියේ බැවින් එම ඉල්ලීම් ලිපිය ලැබුනේ ඊට පසුව බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසූයේ ආණ්ඩුකාරතුමියගේ ලිපියක් ආවෙ, අපි ලිපිය යවලා කොච්චර කාලෙකට පස්සෙද යන්නත්, නමුත් එතුමා සිටින කාලයේ කඩේක ප්‍රශ්නයක් වෙලා කඩේ පවරා ගත් බවත්, පසුව ආණ්ඩුකාර තුමාට අනුමැතිය ලබා දෙන ලෙස ලිපියක් යැවූ බවත්, මාස හයක් හතක් කඩේ ආදායමක් නැති වෙනකොට තමන් ආණ්ඩුකාර තුමාගේ අවසරය පැත්තකට දමා තමාගේ බලය පාවිච්චි කර කඩේ ටෙන්ඩර් කර ලබා දුන් බවත්, එහෙම නැතුව මෙය කළ නොහැකි බවත්ය.

ගරු උප සභාපතිතුමා පැවසූයේ එදත් එතුමා මේ ගැන කතා කළ බවත්, මේක සම්පූර්ණ ඇත්ත කතාවක් බවත්, මේ අකාර්යක්ෂමතාවලට හේතු බවත්, සභාවේ පසු විපරමක් නොමැති බවත්, දැන් විශේෂයෙන්ම ගරු සභාපතිතුමා සහ තමන් මේ පාලන තන්ත්‍රයේ සිටිනවිට අනිවාර්යයෙන්ම කාර්යක්ෂම වීම අවශ්‍ය බවත්, අපි හැමදාම කියන විදිහට මේක සම්බන්ධයෙන් ඔබතුමා මේකට විධිමත් පියවරක් ගන්නේ නම් වටිනා බවත්, මොකද මෙහෙම ගියොත් මේ අකාර්යක්ෂමතාව තව තවත් දිග්ගැස්සෙන බවත්ය.

**06:04:02** 2026 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදන රු.500,000 ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්නේ කවදාද?

ගරු සභාපතිතුමා ඉහත ප්‍රශ්නයට පිළිතුරු කල් දී ඇති ප්‍රශ්න අංක 06:01:02 දී ලබා දෙන ලදී.

**06:05 ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා**

**06:05:01** බළන්ගොඩ නගර සභාව සතු නිල නිවාසවල වර්තමාන පදිංචිකරුවන් කවුරුන්ද සහ එම එක් එක් නිල නිවාසවල වර්තමාන අලුත්වැඩියා තත්වයන් කවරේද?

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා පැවසූයේ සභාව සතු නිල නිවාස වල වර්තමාන පදිංචිකරුවන් පහත පරිදි වන බවයි.

| අනු අංකය | වරිපනම් අංකය | පදිංචි අයගේ නම සහ තනතුර | පදිංචි දිනය |
|---|---|---|---|
| 01 | අංක 04,පරණ පාර | ඒ.පී ෂැලෝම් ඒන්ජල් වාස් මිය-කළමණාකරණ සේවා නිලධාරී | 2024.05.02 |
| 02 | අංක 06,පරණ පාර | උසාවි නියෝගයක් මත සහල් ගබඩා කර ඇත. | 2025.09.05 |
| 03 | අංක 08,පරණ පාර | එම්.ජී.එස් ගුණවර්ධන මිය-ගණකාධිකාරී | 2026.04.01 |
| 04 | අංක 217/17,රත්නපුර පාර | එස්.එම්.සී.එස්. කේ අබේසිරිවර්ධන මයා-වැඩ අධිකාරී | 2025.10.31 |
| 05 | අංක 217/18,රත්නපුර පාර | එච්.වයි.අනුෂා දමයන්ති මිය-ආදායම් පරීක්ෂක | 2025.08.01 |

**ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා පෙ.ව.10.25ට සභාවට පැමිණෙන ලදී.**

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විමසුයේ, නඩු කටයුත්තකට අදාළව සහල් ගබඩා කර ඇති නිල නිවාසයෙන් එම සහල් තොගය වෙනත් ස්ථානයකට යොමුකර කර එම නිල නිවාසය නිලධාරියෙක්ට ලබාදීමට හැකියාවක් නැතිද යන්නයි.වැඩි දුරටත් එතුමා පැවසුයේ එම සහල් තොගය ඉතා දිගු කාලයක් තිස්සේ ගබඩා කර පවතින බවත්,එය සභාවට  අදාළ කටයුත්තක්ද යන්න පිළිබඳව  තමාට අවබෝධයක් නොමැති බවත්ය.

අනතුරුව මෙම නඩු කටයුත්ත පිළිබඳව මහජන සෞඛ්‍ය පරීක්ෂක තුමන්ගෙන් කරුණු විමසීම සඳහා ගරු සභාපතිතුමා මහ සභාව කාරක සභාවක් බවට යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා එකී යෝජනාව ස්ථිර කර ලදී.

මහජන සෞඛ්‍ය පරීක්තුමන්ගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී එන් සේනාරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්විය.

**06:05:02** බැංකියවත්ත කසළ අංගනයෙහි කාර්යාලය සඳහා අවශ්‍ය උපකරණත් තිබියදී ස්ථිර කාර්යය මණ්ඩලයක් අනුයුක්ත කර පවත්වාගෙන නොයන්නේ ඇයිද යන්න කරුණු දක්වන්න.

ඉහත ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙමින් ගරු සභාපතිතුමා සඳහන් කලේ මාර්තු මාසයේ සිටම නිලධාරීන් මේ සඳහා එක එක් දිනය වෙනුවෙන් යොදවා ක්‍රියාත්මක කළ නමුත් එය ප්‍රායෝගික නොවන බව දැනුණු බැවින් දැනට ස්ථිරවම සම්පත් කුමාර මහත්මයා බැංකියවත්ත කසළ කළමණාකරණ මධ්‍යස්ථානය වෙත යොදවා ඇති බවයි.

මෙම අවස්ථාවේ ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා සඳහන් කලේ කසළාංගනයට අදාළව ඩේලි රිපෝට් (Daily Report) එකක් ගන්න යෝජනා කරන බවත්, එය සභාවට ඉදිරිපත් කළ යුතු බවත්ය.

**07. කල් දී ඇති යෝජනා**

**07:01 ගරු සභාපති එන්.ඩබ්.පී.ටී.ජයසේන මැතිතුමා**

**07:01:01** වැකුඹුර මාර්ගය කොන්ක්‍රීට් කිරීම කර්මාන්තයට අදාළ අවසන් මුදල වන රු.1,005,905.38ක මුදල සුහද වැඩිහිටි සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා ඉහත සංවර්ධන මාර්ගයේ ස්ථානය පිළිබඳව විමසන ලදුව කාර්මික නිලධාරී මහතාගෙන් කරුණු විමසීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අනතුරුව එම කර්මාන්තයේ ස්ථානය පිළිබඳව කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:02** බැංකියවත්ත කසළ කළමණාකරණ මධ්‍යස්ථානයේ අට්ටි ගැසීමේ ස්ථානය පුළුල් කිරීම කර්මාන්තයට අදාළ අවසන් බිල්පතට අදාළ රු.2,404,146.28 ක මුදල චන්ද්‍රසිරි කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.ඒ හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ ලොකු ප්‍රශ්නයක් තිබෙන බවත්, නිලධාරීන් අධීක්ෂණයක් සිදු කිරීම අවශ්‍ය බවත්, මේකේ Foundation දාලා තියෙන නමුත් ගිහින් බලද්දී ඒකේ ෆවුන්ඩේෂන් එක නයා ගියා වගේ ඇද බවත්, සාමාන්‍යයෙන් ව්‍යාපෘතියක් කරනකොට අධීක්ෂණයක් පැවතිය යුතු බවත්, නමුත් කිසිම අධීක්ෂණයක් නැතුව මේ විදියට Foundation එකට ලක්ෂ 24ක් වැය කර ඇති බවත්, මෙම ව්‍යාපෘතිය හරි විදිහට නිම කරලා තියෙනවද යන්නත්, තාක්ෂණ නිලධාරීන් ඒ සම්බන්ධව අනුමැතියක් නිර්දේශයක් ලබා දී ඇත්ද යන්නත්, එම නිලධාරීන් මෙය බලන්නේ නැද්ද යන්නත්, මෙහි සුපර්වයිසර්ලා සිටින නමුත් කොහේ වැඩ ටික කෙරෙනවද කියලා දන්නේ නැති බවත්, සභාපතිතුමා ගොස් ෆවුන්ඩේෂන් එක දාලා තියෙන විදිහ නිරීක්ෂණය කරන ලෙසත්, මේ කාර්යය හරියට සිදු විය යුතු බවත්, නිකන් ඔය විදිහට කරන්න දෙන්න එපා යන්නත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:03** බළන්ගොඩ නගරයේ කසළ ඉවත් කිරීමේ සඳහා 2026 අප්‍රේල් මස ගෙවීම රු.1,250,000.00 ගෙවීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීම.

**ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා මෙහිදී අදහස් දක්වමින් ඉහත යෝජනාව සම්බන්ධව කතා කිරීමට අවශ්‍ය බවත්, කසළ එකතු කිරීමට අදාළව කාණු කොටස එයා කරන්නේ නැහැ කියලා ටෙන්ඩර් එක කරන මහත්මිය පවසා ඇති බවත්, එවිට මෙම සභාවේදී කාණු පිරිසිදු කිරීම කොටස සිදු නොවන බැවින් අප්‍රේල් මාසයේ කසළ ටෙන්ඩරයට ඉහත මුදල අනුමත කිරීමට නොහැකි බවත්, ඒක නිසා මේ ඊළඟ වාරිකය මැයි මාසෙදි ගෙවීම් කිරීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතු බවත්, ඒ වගේම මෙය කසළ ටෙන්ඩර් එක ගත්ත මහත්මියගේ විතරක් නෙවෙයි, මෙහි අධීක්ෂණය සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙන බවත්, රාස්සගල පාරේ සුසානභූමිය ළඟ කුණු ගොඩවල් පවතින බවත්, දැන් දවස් ගානක් තිස්සේ කියන බවත්, කසළ ටෙන්ඩර්කරුට මෙය ගැටළුවක් නොවන බවත්, ටෙන්ඩර්කරුට මුදල් ලැබුණාම ඉවර බවත්, නමුත් අධීක්ෂණය කරලා අධීක්ෂණ වාර්තාව ලබා දෙන අය වැරැද්ද කරන බවත්, නගරයේ හැමතැනම මේ ආකාරයෙන් පවතින බවත්ය.

එබැවින් මෙහි නිවැරදි අධීක්ෂණය සිදු විය යුතු බවත්, දිගින් දිගටම මේ හේතුවෙන් ගරු සභාපතිතුමා,තමන් මෙන්ම සභාවද අපහසුතාවයට පත්වන බවත්, එසේම මන්ත්‍රී මණ්ඩලයත් මෙම කසළ කළමනාකරණය හරියට සිද්ධ වෙන්නේ නැති බවට සාක්ෂි දරන බවත්, එය ටෙන්ඩරය ලබාගත් මහත්මියගේ වැරැද්දක් නොව අධීක්ෂණය කරන නිලධාරීන්ගේ වැරැද්දක් බවත් එතුමා වැඩිදුරටත් පැවසීය.

එසේම කසළ එකතු කරලා කරත්තෙන් ගෙනල්ලා පාලම ළඟ, විකුණන්න පුළුවන් ටික ඔක්කොම කරත්තෙට දාලා ඉතිරි ඔක්කොම ඇළට විසි කරනවා වීඩියෝ එකක් තිබෙන බවත්, මෙය දිගින් දිගටම සිදු නොවිය යුතු බවත්, මෙම කසළ කළමනාකරණය කියන්නේ අපි මාසෙකට ලක්ෂ දොළහක් පමණ වන ගෙවීමක් බැවින් ඇත්තටම මේක මීට වඩා අධීක්ෂණයක් සිදු විය යුතු බවත්, අධීක්ෂණ නිලධාරීන් දෙදෙනෙකු සිටින බවත්,තමන් මේ කියන වීඩියෝ එක ගත්තේ තමන්ම බවත්,එය ගන්නකොට මීටර් සීයක් එහා පැත්තේ අධීක්ෂණ නිලධාරීන් දෙන්නම සිටි බවත්, එම දෙදෙනාට මෙය පේන්නේ නැද්ද යන්නත්, තමන් සද්ද නැතුව ඉඳලා අදදින මේ සම්බන්ධව කතා කළ බවත්,

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් මේක මෙහෙම වෙන්න දෙන්න බැරි බවත්, අනිවාර්යයෙන්ම නිවැරදි කළ යුතු බවත්, ඊළඟ වර කොහොමවත් මේ දොළොස් ලක්ෂය එතුමා සිතන පරිදි ගෙවන්න අනුමැතිය දෙන්නේ නැති බවත්,මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමන්ද කාණු පවිත්‍ර කරන්නෙත් නැහැ කියලා පැවසු බවත්, ඒ අනුව එම ඉතිරිවන මුදලින් කාණු ටික සභාවෙන් පවිත්‍ර කිරීමට කටයුතු කළ යුතු බවත්, එබැවින් මේකට අවධානය යොමු කරලා, විශේෂ කාරණා විදිහට අධීක්ෂණය සහ කාණු සම්බන්ධව ක්‍රියා කළ යුතු බවට ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරන බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා පැවසුයේ, අදදින සම්බන්ධීකරණ කමිටුව වෙත ගොරොක්ගහමඩ කාණු පද්ධතිය සුද්ධ කිරීමට පාර්ලිමේන්තු මන්ත්‍රී වසන්ත මන්ත්‍රීතුමා යෝජනාවක් ඉදිරිපත් කර ඇති බවත්, එය සම්බන්ධීකරණ කමිටුවේ පිළිතුරු ලෙස දාලා තියෙන්නේ නගර සභාවේ වගකීමක් ලෙසට බවත්ය.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ මෙම කාණු පද්ධතිය සකස් කිරීම සම්බන්ධ වගකීම පැවරෙන්නේ මාර්ග සංවර්ධන අධිකාරියට බවත්, නමුත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ න්‍යාය පත්‍රය සකස් කරන විෂයභාර නිලධාරියා මඟින් එලෙස වගකීම නගරසභාව ලෙසට ඇතුළත් වී ඇති බවත්ය.

ගරු සභාපතිතුමා පැවසූයේ කාණු පද්ධතිය පිරිසිදු කිරීම සම්බන්ධයෙන් ටෙන්ඩර්කරු එය සිදු නොකරන්නේ නම් ටෙන්ඩර්කරුගෙන් එය ලිඛිතව ලබා ගැනීම සුදුසු බවත්, ඒ පිළිබඳව

තමන් මේ වන තෙක් දැනුවත් කර නොමැති බවත්ය. ගරු උපසභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ එතුමියගෙන් ලිඛිතව ඉල්ලගත්තොත් ඇත්තටම ඒක අසාධාරණ බවත්, මොකද එතුමන්ලා සේවය සපයන බවත්, මේක අධීක්ෂණ නිලධාරීන්ගේ වරදක් බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා පැවසුයේ පසුගිය අපේල් 13 වැනිදාද මෙවැනි සිදුවීමක් සිදු වූ බවත්, නගරයේ කොහෙවත් එදා ගොඩක් කුණු එකතු ඇදලා තිබුණේ නැති බවත්, නමුත් තමන් 15 වැනිදා මාර්කට් එකට ගිය බවත්, එහිදී මාර්කට් එක පිටිපස්සේ තනිකර පණුවෝ සිටි බවත් එහි වීඩියෝවක් තිබෙන බවත්, පුද්ගලයෙක් මන්ත්‍රීතුමා මට එන්න කිව්වා ඇවිත් බලන්න කියලා පැවසූ බවත්, එදින පිළිබඳව සොයා බැලීමේදී ටෙන්ඩර්කරුගේ සේවකයන් සිටි බවත්, නමුත් සභාවේ රියදුරන් සේවයට නොපැමිණීම හේතුවෙන් එදින කුණු එකතු කිරීම සිදු නොකළ බව පැවසූ බවත්ය.

ගරු සභාපතිතුමා සඳහන් කලේ මෙම කටයුතු විධිමත්ව සිදුවේද යන්න අධීක්ෂණය කිරීම සඳහා නිලධාරීන් යොදවා ඇති බවත්, එම අධීක්ෂණ නිලධාරින්ගේ රාජකාරිය නිසි පරිදි සිදු විය යුතු බවත්, එම අධීක්ෂණ නිලධාරීන් අධීක්ෂණය කිරීමට වෙනත් නිලධාරීන් යොමු කළ නොහැකි බවත්, එසේ නොවන්නේ නම් එයට ක්‍රියාමාර්ග ගත යුතු බවත්, එමෙන්ම සභාවේ නිලධාරින්ට වැටුපක් ගෙවන බැවින් සියළු දෙනාගෙන් පැවරී ඇති රාජකාරිය නිසි පරිදි සිදු විය යුතු බවත්ය.ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා පැවසුයේ මෙය සභාවේ සාකච්ඡා කලද කාර්යය මණ්ඩල රැස්වීමක් රැස්කර සාකච්ඡා කිරීම සුදුසු වන බවයි.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

මෙහිදී ගරු සභාපතිතුමා ක්ෂණිකව දැනුම්දිය යුතු යෝජනාවක් පවතින බවත්, අපජලය කළමණාකරණය කිරීම සම්බන්ධයෙන් යෝජනාවක් ලබා දෙන ලෙස පළාත් පාලන කොමසාරිස්තුමා දැනුම් දුන් බවත්, ඒ අනුව දැනට බළන්ගොඩ නගරයේ අපජලය පිරිපහදුවකින් තොරව බැහැරකරන බැවින් ඒ සඳහා යෝජනාව ලෙස බළන්ගොඩ නගරයේ අපජලය පිරිපහදු කර දොරවෙල ඔයට බැහැරකිරීම සඳහා වන අපජල කළමණාකරණ ව්‍යාපෘතිය යෝජනා කරන බවත්, ඒ සඳහා සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට අදහස් කරන බවත්, වෙනත් යෝජනා පවතීනම් ඉදිරිපත් කරන ලෙසත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.ඒ හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් පැවසුයේ එය ඉතාමත් හොඳ යෝජනාවක් බවත්, මුගුණමලය පැත්තට ගියාම බොහෝ දෙනෙක් දොරවෙල ඔය භාවිතා කරන බවත්, නගරයේ සියළු අපජලය මුදාහැරෙන්නේ දොරවෙල ඔයට බැවින් එය හොඳ වැඩක් බවත්ය.

**07:01:04** ජල සැපයුම ලබා ගැනීම වෙනුවෙන් මාර්ග පළුදු ලෙස සභාවට අයකරගත් රු.4000.00 මුදලින් රු.2500.00 ක මුදල ජී.එම් ප්‍රියදර්ශනී යන අයට ආපසු ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම මාර්ග පළුදු කිරීමට අදාළ ස්ථානය පිළිබඳව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ මාර්ගය හරහා පලුදු කිරීමට තමයි ඉල්ලීම් කර තිබුනද එතනදී මාර්ගය හරහා පලුදු කිරීමට අවශ්‍ය වී නොමැති බවත්, ඒ නිසා මාර්ගයේ පැත්තක වලක් හෑරීමට අවශ්‍ය වී ඇති බවත්, ඒ සඳහා රුපියල් 1500ක මුදලක් අය කරගෙන ඇති බවත්, ඒ අනුව රු.4000න් ඉතුරු මුදල ගෙවීමට ඉදිරිපත් කර ඇති බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා නැවතත් අදහස් දක්වමින් පැවසුයේ මෙලෙස රු.1500කින් මෙවැනි වැඩක් කිරීමට හැකියාව පවතීනම් රුපියල් ලක්ෂ 3කින් පමණ මාර්ගයක මීටර් 100ක් පමණ නඩත්තු කිරීමට හැකිවනු ඇති බවයි.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:05** 2026 වර්ෂයේ ජාතික වෙසක් සතිය 2026.05.27 දින සිට 2026.06.02 දින දක්වා විවිධ වැඩසටහන් පවත්වමින් සැමරීම සඳහා 2026.04.17 දිනැති ස්වදේශ කටයුතු චක්‍රලේඛ අංක 03/2026 මඟින් වැඩසටහන් යෝජනාවලියක් ඉදිරිපත් කර ඇත.

ඒ හා සමගාමීව බළන්ගොඩ නගර සභාව මඟින් නගර සභා බල ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් පහත පරිදි ප්‍රජා සත්කාරක සහ ආගමික වැඩසටහන් මාලාවක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති අතර ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සහ ඒ සඳහා වන දළ ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා ගැනීම.

| **දිනය** | **වැඩසටහන** | **ස්ථානය** | **සහභාගීත්වය / දායකත්වය** |
|---|---|---|---|
| 2026.05.15 | ලේ දන්දීමේ කඳවුර | බළන්ගොඩ නගර සභා ශ්‍රවණාගාරය | බළන්ගොඩ මූලික රෝහලේ වෛද්‍ය කාර්ය මණ්ඩලය |
| 2026.05.27 | වැඩිහිටි අක්ෂි සායනය | බළන්ගොඩ නගර සභා ශ්‍රවණාගාරය | බළන්ගොඩ මූලික රෝහලේ වෛද්‍ය |

| | | | |
|---|---|---|---|
| | | | කාර්ය මණ්ඩලය |
| 2026.05.29 | පින්කම් මාලාව සහ ධර්ම දේශනය | බළන්ගොඩ නගර සභා ශ්‍රවණාගාරය | ප්‍රදේශවාසී සැදැහැවතුන් සහ කාර්ය මණ්ඩලය |
| 2026.05.31 | මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | තුඹගොඩ සාංඝීක විහාරය | බළන්ගොඩ පොලීසිය සහ දහම් පාසල් දරුවන් |
| 2026.06.02 | පවිත්‍රතා ශ්‍රමදානය | බළන්ගොඩ දොරවෙල ඔය දෙපස | ප්‍රජා සංවිධාන සහ ස්වේච්ඡා කණ්ඩායම් |

| අංශය | මුදල (රු.) |
|---|---|
| 1. අක්ෂි සායනය | 17000 |
| 2. ධර්ම දේශනාව | 65,000 |
| 3. මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන | 12,500 |
| 4. ශ්‍රමදානය | 45,000 |
| **අනපේක්ෂිත වියදම්** | **5000** |
| **මුළු ඇස්තමේන්තුව** | **144,500** |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් පැවසුයේ එතුමා ඉතා හොඳ බෞද්ධයෙකු බවත්, මෙම වැඩසටහන් ටික හොඳ බවත්, 2026 වර්ෂයේ අයවැය මඟින් වෙසක් උත්සවය සඳහා මුදල් වෙන් කිරීමක් සිදු කර නොමැති බවත්, අරමුදල් සපයා ගන්නා ආකාරය පිළිබඳවද දැනගැනීමට අවශ්‍ය බවත් ශ්‍රමදාන කටයුත්තක භාණ්ඩ ලබා ගැනීම සඳහා රු.15000ක වියදමක් පෙන්වා ඇති බවත් ඒ පිළිබඳව දැනගැනීමට අවශ්‍ය බවත් පවසන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා පැවසුයේ මෙහි ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව මඟින් රු.65,000ක මුදලක් ධර්මදේශනය සඳහා දක්වා ඇති බවත්, ධර්මදේශනාවකට එතරම් මුදලක් වැය කිරීම තේරුමක් නැති වැඩක් බවත්, එය ස්වාමීන් වහන්සේ නමක් සම්බන්ධ කරගෙන සිදු කළ හැකි බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ ඇස්තමේන්තුව දක්වා ඇති මුදල් ඒ ආකාරයෙන්ම වැය වීමක් සිදු වීමක් නොවනු ඇති බවත්,ඊට වඩා අඩු වෙනු ඇති බවත්, උදාහරණයකට ලේ දන් දීමේ ව්‍යාපාරයට වියදමක් යන්නෙම නැති බවත්, ඒ සඳහා අවශ්‍ය තැඹිලි වලට කෑම වලට දායකත්වය මේ වන ලබා දෙන බව පවසා ඇති බවත්, එලෙස සභාවේ මන්ත්‍රීතුමාලාටත් මේ සඳහා මැදිහත් විය හැකි බවත්ය.

මෙහිදී අදහස් දැක්වූ ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සඳහන කලේ හිටපු ගරු සභාපතිතුමා පැවසූ කතාව ඇත්ත බවත්, එම ධර්මදේශනය සඳහා විශාල වියදමක් යන්නේ නැති බවත්, වාහන පහසුකම් පමණක් ලබා දිය යුතු බවත්, එම ස්වාමීන් වහන්සේ පිරිකරත් එපා කිව්ව බවත්, මෙතරම් ඇස්තමේන්තුවක් දමා ඇත්තේ ඇයිද යන්න නොදන්නා බවත්ය.

මෙම වැඩසටහන් සඳහා අනුග්‍රහයක් ලබා ගැනීම සුදුසු බව ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා සඳහන් කලේය.මෙහිදී ඉහත මත් ද්‍රව්‍ය නිවාරණ වැඩ සටහන සඳහා පොලිසියේ නිලධාරී මහතුන් සම්බන්ධ කරගන්නේ නැතිව ඒ සඳහා සංශෝධනයක් ලෙස විශ්‍රාමික සුරාබදු නිලධාරී කපිල වීරසිංහ මහතා දේශනය සඳහා සම්බන්ධ කර ගැනීමට යෝජනා කරන බවත්, එතුමා සම්බන්ධ කර ගන්නේ නම් අර්ථවත් දේශනයක් ලබා දෙනු ඇති බවත්ය.

මෙම අවස්ථාවේ මුදල් ප්‍රතිපාදන සම්බන්ධව ගණකාධිකාරීතුමියගෙන් කරුණු විමසීම් කිරීම වෙනුවෙන් ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන ලදී.

අදාළ කරුණු විමසීම් කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:06** බළන්ගොඩ නගර සභාවට අයත් නව පදික කඩ කාමර ඉදිකිරීමේ අරමුණ වූයේ නගරයේ තැනින් තැන විසිරී සිටින පදික වෙළඳුන් සඳහා ස්ථිර ස්ථානයක් ලබා දීමයි.මෙම කඩ කාමර ඉදිකරන ලද්දේ පදික වෙළඳුන්ගේ කී මනි මුදල් මත වේ.එම නිසා මෙම කඩ කාමර දිගින් දිගටම ලබා දෙනු ලැබුයේ පදික වෙළඳුන් සඳහා වන අතර ටෙන්ඩර් කිරීමක් සිදු නොවුනි.නමුත් දීර්සකාලීනව කඩ කාමර අංක 26,28 දරණ කඩ කාමර වසා තැබීම හේතුවෙන් සභාවට ලැබිය යුතු ආදායම අහිමි වී ඇත.එම නිසා මෙම කඩ කාමර සඳහා

සුදුසු පදික වෙළඳුන් දෙදෙනෙකු ස්ථානගත කිරීම හෝ ටෙන්ඩර් මඟින් වෙනත් පාර්ශවයක් වෙත ලබා දීම කළ යුතුව පවතින අතර ඒ පිළිබඳව සුදුසු තීරණයක් ලබා ගැනීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම කඩ කාමර හිමියන්ට දැනුම් දී ඇත්ද යන්න ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසූයේ දැනට එම කඩ කාමර සභාව වෙත පවරා ගෙන ඇති බවත්, එම කඩ කාමර හිමියන්ට ඉල්ලීමක් කිරීමට අවස්ථාවක් තිබුනද එලෙස ඉල්ලීම් යොමු කර නොමැති බවත්ය.

ගරු උප සභාපති නදිශාන් වික්‍රමාරච්චි මැතිතුමා සඳහන් කලේ මෙහි ගැටළුව වී ඇත්තේ මෙම කඩ කාමර ලබා දීමේදී එක් අයෙකුගෙන් රු.140,000.00ක් අයකර ලබාදී ඇති බවත්, ඒ අනුව මෙම කඩ කාමර නැවත පදිකයන්ට ලබා දෙන්නේ නම් එම මුදල පිළිබඳවද තීරණයත් ලබා ගත යුතු බවත්, එසේ නොවන්නේ නම් පෙර කඩ හිමියන්ට එය අසාධාරණයක් වනු ඇති බවත්ය.

මෙහිදී ගරු සභාපතිතුමා පැවසූයේ එසේනම් ටෙන්ඩර් කැඳවීමේදී තැන්පතු මුදලක් ලෙස එම රු.140,000.00ක මුදල ලබාගෙන එම අයට එකී මුදල ලබා දෙනවාද යන්න තීරණය කළ යුතු බවයි.ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ එලෙස ලබා දිය හැකි ක්‍රමවේදයක් පවතීනම් එය සලකා බැලිය යුතු බවයි.

කඩ හිමියන් සමඟ එළඹ ඇති ගිවිසුම අනුව බැලිය යුතු බව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පවසන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමාද සඳහන් කලේ එම ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතු බවත්, කඩ කාමරය සභාව වෙත පවරා ගෙන ඇත්තේ එම පුද්ගලයන් ගිවිසුම කඩ කිරීම හේතුවෙන් බවත්, ඒ අනුව තැන්පතු මුදල් නිදහස් කිරීමක් සිදු කළ නොහැකි බවත්ය.

ඒ අනුව ගරු උප සභාපති නදිශාන් වික්‍රමාරච්චි මැතිතුමා ඉහත පදික කඩ අංක 26,28 දරණ කඩ කාමර ටෙන්ඩර් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදුව ගරු සභාපතිතුමා, පදික වෙළඳුන් වෙත කඩ කාමර ලබා දීම වෙනුවෙන් තෝරා ගැනීමක් සිදු කිරීම කළ නොහැකි බැවින් ටෙන්ඩර් කිරීම සුදුසු බවට වන යෝජනාව ස්ථිර කරන ලදි.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා අදහස් දක්වමින් මෙම පදික කඩ කාමර ටෙන්ඩර් කිරීමේදී දැනට පදික වෙළඳාමේ නිරත වී සිටින වෙළඳුන් වෙත කුමක් හෝ ප්‍රමුඛතාවයක් ලබා දිය හැකිනම් ඒ පිළිබඳ සලකා බැලිය යුතු බවත්, එසේ වුවහොත් පදික වෙළඳාමේ නිරතවන දෙදෙනෙකු සඳහා හෝ විසඳුමක් ලැබෙන

බවත්,එසේ නොමැතිනම් එය තවදුරටත් පදික වෙළඳුන් දෙදෙනෙකු හෝ අඩුකිරීමට විසඳුමක් නොවන බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ මෙහි ඇති ගැටළුව වන්නේ සභාවට ලැබිය යුතු ආදායම අහිමි වී ඇති බව බවත්, පදික වෙළඳුන්ට කඩ කාමර දෙක ලබා දෙන්නේ නම් එසේ ලබා දීමේදී තෝරාගතයුතු ක්‍රමවේදයක් නොමැති බවත්ය.

මෙම කඩ කාමර වසා තබා අඛණ්ඩව කුලිය ගෙවා ඇත්ද යන්න ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ කඩ කුලිය ගෙවා නොමැති බැවින් සභාවට පවරා ගෙන ඇති බවත්, පසුව එම කඩ කාමර හිමියන් ඉල්ලීමක් කර නොමැති බවත්ය.

මෙම කඩ කාමර මීට පෙර ලබාදීමේදී පදික වෙළඳුන්හට කඩ කාමර ලබාදුන් කුමක් හෝ ක්‍රමවේදයක් පවතින්නට ඇති බවත් ඒ අනුව එම ක්‍රමවේදයටම මෙම කඩ කාමරද කාලයක් තිස්සේ සිටින පදික වෙළඳුන්ට ලබාදීම සුදුසු බවත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා සඳහන් කරන ලදී.

ඒ අනුව ඉහත පදික කඩ කාමර ටෙන්ඩර් කිරීමේ යෝජනාව සඳහා විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**07:01:07** බළන්ගොඩ නගර සභාවට අයත් කඩ කාමරවල බදු අයිතිය සංශෝධනය කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්තුමාගේ CLG/LG/-5/3/1 – (IV වෙළුම) හා 2026.03.10 දිනැති ලිපිය අනුව අතුරු බදු ලබා දී ඇති කඩ කාමරවල බදු අයිතිය අතුරු බදුකරුගේ නමින් සංශෝධනය කර ගැනීම සඳහා පහත බදුකරුවන් විසින් ඉල්ලීම් කර ඇති අතර ඉදිරි කටයුතු සිදු කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම.

| අනු අංකය | කඩ කාමර අංකය | ගිවිසුම්ගත බදුකරුගේ නම | අතුරු බදුකරුගේ නම |
|---|---|---|---|
| 01. | නව බස් නැවතුම්පොළ කඩ කාමර අංක බී-01 | සිත්තරවේලු තුෂාන්දන් | මොහොමඩ් උවයිස් මොහෙමෙඩ් රූමි |

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:08** බැංකියවත්ත කසළ අංගනයේ දෛනිකව එකතුවන වාණිජ වටිනාකමක් ඇති නොදිරන කසළ තොගයක් එක්රැස්වූ පසු ටෙන්ඩර් කර විකිණීම සිදු කරනු ලැබේ.මේ හේතුවෙන් මාස 03 ක පමණ නොදිරන කසළ එක්රැස්වීමක් සිදුවන අතර ඒ නිසා කසළ අංගනයේ ඉඩ ඇහිරීමක් සිදු වේ.එම නිසා මාස 06කට වරක් ටෙන්ඩර් කර එම මිල ගණන් යටතේ නිලධාරියාගේ අධීක්ෂණය යටතේ සති දෙකකට වරක් නොදිරන කසළ අලෙවි කිරිම සිදු වන්නේ නම් කසළ අංගනයේ ඉඩ ඇහිරීමක් සිදු නොවන නිසා මේ පිළිබඳව සලකා බලා සුදුසු තීරණයක් ගැනීම සහ බළන්ගොඩ ජාතික පාසලේ 3R ඒකකය සහ සම්පත් පියස යන මධ්‍යස්ථාන වල එකතුවන ද්‍රව්‍ය එම ස්ථානයේදීම අලෙවි කිරීම සම්බන්ධයෙන් සුදුසු තීරණයක් ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳ අදහස් දක්වමින් ගරු සභාපතිතුමා පැවසුයේ කසළ අංගනයේ සාමාන්‍යයෙන් තොග එක්රැස් වූ පසු තමයි ටෙන්ඩර් කරන බවත්, එම ටෙන්ඩර් කමවේදයට කාලයක් ගතවන බවත්, එහිදී එම ස්ථානයේ ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන බවක් සිදු වන බැවින් ඉහත පරිදි යෝජනා කරන්නේ, මාස හයකට ටෙන්ඩර් කරලා, ඒ මාස හය ඇතුළත ඒ මිලට එක්රැස් වෙන ටික තොග රැස්කිරීමකින් තොරව එකතු වෙන ටික විකිණීමට යෝජනා කරන බවත්,ඊළඟ මාස හයට නැවත ටෙන්ඩර් කරලා අලුත් මිලට ඒ එකතු වෙන තොගය රැස් කිරීමකින් තොරව ලැබෙන තොග හැකි පරිදි විකිණීමට යෝජනා කර ඇති බවත්ය.එමෙන්ම ජාතික පාසලේ 3R ඒකකයෙන් සහ සම්පත් පියසෙන් එකතු නොදිරන කසළ වෙනදා සිදු කරන්නේ නැවත බැංකියවත්තට ගෙනල්ලා එතනින් විකිණීම බවත්, මෙහිදී යෝජනා කර ඇත්තේ ඒ පාසලෙන්ම අදාළ ගැණුම්කරුවාට දෙන්න හැකියාව යෝජනා කර ඇති බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා සඳහන් කලේ ඉහත පරිදි කෙලින්ම ටෙන්ඩර්කරුට ගිහින් ගන්න දුන්නොත් මිල පාලනය පිළිබඳ ක්‍රියාවලිය කෙසේද යන්න විමසන ලදුව ගරු සභාපතිතුමා සඳහන් කලේ සභාවේ මැදිහත්වීමක් ඇතිව එය සිදු වන බවයි.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා, මේ යෝජනාව ගෙනාවේ කවුද යන්නත් මෙහි අධීක්ෂණ නිලධාරියා කවුද යන්නත් විමසන ලද අතර ගරු සභාපතිතුමා ඊට පිළිතුරු දෙමින් පැවසුයේ සෞඛ්‍ය අංශයෙන් යෝජනාව ඉදිරිපත් කළ බවත්, මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා හරහා අධීක්ෂණය වන බවත්ය.

ඉහත ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා නැවතත් අදහස් දක්වමින් කොම්පෝස්ට් එකේ තරාදියට කොම්පියුටර් සිස්ටම් එකෙන් බර දාලා සිස්ටම් එකක් හදන්න තමන් පැවසූ බවත්, එය තවම සිදු වී නොමැති බවත්,බාලා යන අය මේ බඩු ටික ගන්නා බවත්, ඉස්කෝලේ ළමයින්ගෙන් එතනින් මිලදී අරගෙන මෙතන විකුණන්න හදන බවත්, මේ ගැණුම්කරුවාව ඉස්කෝලේ ළමයින්ට ඍජුව සම්බන්ධ කරලා දුන්නා නම්, ඒ ළමයි තව කීයක් හරි හොයාගන්නා බවත්, මෙය හරියට කළමනාකරණය කරන්න යන්නත්, මෙහි තරාදියට කොම්පියුටර් ප්‍රින්ටර් එකක් එන්න හයි කරන්න කියලා කිව්වහම තාම ඒක හයි කරගන්න බැරි මොකක්ද හේතුව කියලා බලන්න යන්නත්, කොම්පෝස්ට් එකේ වෙන වැඩ තමන් ඉදිරියේදී පවසන බවත්, නොදිරන කසළ පොලිතින්, ප්ලාස්ටික් විකුණන්න පුළුවන් මුදල් බවට පත් කරගන්න පුළුවන් හැකියාව තියෙන බඩු ටිකට මෙච්චර මෙහෙම කරන්න අවශ්‍යා නැති බවත්, මෙහි නොදිරන කසළ තියන්නේ වෙනම පැත්තක ,කොම්පෝස්ට් හදන එක තව පැත්තක තිබෙන බවත්, මෙහි මොකක් හරි ආදායමක් තිබිය යුතු බවත්, එතනින් නොදිරන මාධ්‍යය යනවා නම්, ඉස්කෝලේ ළමයින්ට මෙම ගැණුම්කරුවා එතනට සම්බන්ධ කරලා දුන්නාම සභාව අතරමැදියෙකු වීම අවශ්‍යා නොවෙන බවත්, එම දරුවන්ට තව කීයක් හරි හොයාගන්න හැකියාව ලැබෙන බවත්,අහිංසක ළමයි පවු යන්නත් පවසමින් එතුමා දීර්ඝව අදහස් දක්වන ලදී.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ ඉහත මන්ත්‍රීතුමා පවසන පරිදි තරාදිය පිළිබඳව බැලූ බවත්, එහි ප්‍රගතිය පිළිබඳව මෙම අවස්ථාවේ දැනුවත් නොමැති බවත්, කොම්පෝස්ට් අංගනයට ගිය වෙලාවේ ඒකේ ප්‍රශ්නය දුටු බවත්, ඒ අනුව එතනදී සාකච්ඡා කළ බවත්, එහිදී සතියකින් දෙකකින් හරි විකිණීම කරන ක්‍රමයක් සෑදීමට සාකච්ඡා වූ බවත්ය.

ඊට පිළිතුරු ලබා දෙමින් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ එම ක්‍රමය හොඳ බවත්, මෙහි මැනුවල් බිල් එකක් හැදෙන එක ගැටළුවක් බවත්, එතකොට කොච්චර කිලෝ ප්‍රමාණයක් ආවාද, කොච්චර අවුට්පුට් එකක් ඇවිල්ලාද කියලා නොදන්නා බැවින් එය පැවසූ බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා අදහස් දක්වමින් සති දෙකෙන් දෙකට විකුණනවා කියන එක සලකා බැලිය යුතු බවත්, වටිනාකමක් තියෙන කසළ බවත්, බැංකියවත්තට දාන්න යද්දී වටිනාකමක් තියෙන ටික දාලා, කාඩ්බෝඩ් ටික වෙනම පැත්තකට වැටෙනවා වීඩියෝ එකක් තිබෙන බවත්, එකේ උඩ වැඩියි කියලා එහෙම වැටෙන බවත්, ඒවා බැංකියවත්තට යන්නේ නැති බවත්, දිගින් දිගටම ඇත්තටම තමන් මේ කතාව කියන්නේ මෙහි සිටින නිලධාරීන් හොඳට වැඩ කලාට මෙහි පහළ ඉන්න ශ්‍රේණිවල කම්කරුවෝ ටිකයි ඒ අස්සේ වෙන ප්‍රශ්න හේතුවෙන් තමන් ඇතුළු සභාවද නිකන්

ඇත්තටම හොරු ගාණට වැටෙන බවත්, එබැවින් එයට නියාමනයක් සැදිය යුතු බවත්, එබැවින් තමන් සතියකින් එහෙම ස්ටොක් එකක් හැදෙනවා කියලා හිතත්නේ නැති බවත්, එබැවින් මෙහි යට තියෙන ප්‍රශ්න ඇත්තටම විසඳිය යුතු බවත්, නැත්නම් දිගින් දිගටම මෙය සිදු වුණොත් අපිත් නගර සභාවක් විදිහට මිනිස්සුන්ගේ අප්‍රසාදයට පත්වෙනවා කියලා තමන් කියන බවත්, පවසමින් දීර්ඝව අදහස් දක්වන ලදී.

ඒ පිළිබඳ කරුණු දැක්වූ ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ඉහත මන්ත්‍රීතුමා පවසන කතාව හරි බවත් ,එතන යාඩ් එකේ ඉඩ තියෙනවාද යන්න නිරීක්ෂණය කරන ලෙසත්,එහි සම්පූර්ණයෙන් ඉඩ ඇහිරී ඇති බවත්, ඉහත මන්ත්‍රීතුමන්ලා පවසන කතා හරි බවත්, එයින් යම්කිසි ආර්ථික වශයෙන් මුදලක්ද ලැබෙන නමුත් ප්‍රමුඛතාවය දිය යුත්තේ එහි භූමියට බවත්, ඒ භූමියේ තියෙන සීමිත කොටසේ හැමදේම සිදු කරන බවත් මෙහි අනවශ්‍ය ලෙස ලොකු ලාභයක් ලැබීම නොවන බවත්, මෙතන අනවශ්‍ය ලෙස ගොඩගහගෙන ඉඳලා වැඩක් නැති බවත්, ඊට වඩා වටින්නේ භූමිය අස්කරගන්න එක බවත්, මොකද දවසින් දවස ඩෙංගු ට්‍රැක්ටරයේ ට්‍රැක්ටර් ලෝඩ් ප්‍රමාණය වැඩිවන බවත්, මෙලෙස මාස ගණනක් කසළ ස්ටොක් කරන්න මෙම භූමිය නිකරුනේ භාවිතා කරන බවත්, එයින් සිදු වන්නේ එහි සේවකයන්ගේ වැඩ කිරීමේ තත්ත්වය එපා වෙන බවත්, එය පීඩනයක් බවත්, එම නොදිරන කසළ විවිධ තැන්වලට මාරු කිරීමද එම සේවකයන්ට කරදරයක් බවත්ය.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ මෙය දවසගානේ විකිණීම කළත් ප්‍රශ්නයක් නොමැති බවත්, නමුත් තරාදියෙන් කිරනකොට හරි ක්‍රමවේදය අනුගමනය කිරීම පිළිබඳව තමන් පවසන බවත්ය.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, මෙම කියන ආකාරයේ කොටස තරාදියට සවි කිරීමට සෙවීමේදී එය නොතිබූ බව පැවසූ අතර එම කොටස් නැත්නම් අලුත් තරාදියක් අරන් දුන්නත් එය සභාවට ලාභ බව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පවසන ලදී.

අනතුරුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සඳහන් කලේ තමන් ඉහත ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමාගේ ප්‍රකාශය බැහැර නොකරන බවත්, එතුමාගේ කතාව හරි බවත්,තමන් පවසන්නේද එය විය යුතු බවත්,නමුත් මෙහිදී එම ස්ථානයේ අනවශ්‍ය ලෙස තොග රැස් කරගෙන තබා ගැනීම තේරුමකුත් නැති බවත්ය.

ගරු සභාපතිතුමා පැවසූයේ ඉහත ගැටලුව පවතින බවත්, එයට විසඳුමක් අනිවාර්යයෙන්ම සෙවිය යුතු බවත්, ඉහත යෝජනාවට වෙනසක් කරනවාද එසේ නොමැතිනම් මෙතෙක් පැවති ක්‍රමවේදය භාවිතා කරනවාද යන්න පිළිබඳව මෙහිදී තීරණය කළ යුතු බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා, පසුගියවර ටෙන්ඩරය මඟින් නොදිරන කසළ අලෙවි කළ බැවින් ඒ අනුව එම ආදායම පිළිබඳව දැනගතහැකිද යන්න විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ මෙම අවස්ථාවේ එම තොරතුරු දැනගැනීම වෙනුවෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමට යෝජනා කරන බවයි. එකී යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

බැංකියවත්ත කසළ කළමණාකරණ මධ්‍යස්ථානයේ කටයුතු විධිමත් කිරීම සහ නොදිරන කසළ විකිණීමේ කටයුතු විධිමත් කිරීම සඳහා මුද්‍රිත බිල්පතක් ලබාගතහැකි තරාදියක් මිලදී ගැනීමට අදාළ කරුණු සාකච්ඡා කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

පසුව ගරු සභාපතිතුමා, ඉහත 07:01:08 යෝජනාවට අදාළව පෙර පැවති ක්‍රමයට තිබිය යුතුද නැතිනම් ඉහත යෝජනාව ක්‍රියාත්මක කරනවාද යන්න පිළිබඳව නිශ්චිත තීරණයක් ලබා ගැනීම ගතයුතු බව පැවසීමෙන් අනතුරුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ තොග රැස්වූ පසු අලෙවිකිරීම සුදුසු බවත්, පෙර පැවති තත්වයම පවත්වාගැනීමෙන් බැංකියවත්ත මධ්‍යස්ථානයේ පවතින ඉඩකඩ ගැටළුව විසඳෙන්නේ නැති බවත්, එම ගැටළුව විසඳිය හැක්කේ , මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමෙන් බවත්, ඒ අනුව ඉහත ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පවසන ආකාරයේ ඩිජිටල් තරාදියක් මිලදිගැනීමටත් ඉහත යෝජනාව ක්‍රියාත්මක කිරීමත් සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ නිලධාරී අධීක්ෂණයෙන් එම අලෙවි කටයුතු විනිවිදභාවයෙන් සිදුකිරීමට ඩිජිටල් තරාදියක් මිලදිගැනීමට කටයුතු සිදු කරන අතරතුර, ඉහත යෝජනාව ක්‍රියාත්මක කිරීම සුදුසු බවට වන සංශෝධිත යෝජනාව ස්ථිර කරන බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත සංශෝධිත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා අදහස් දක්වමින් මේ සම්බන්ධව අධීක්ෂණ නිලධාරීන්ගේ මෙන්ම ගරු සභාපතිතුමාගේ අධීක්ෂණය වැදගත් බවත්,සමහරවිට අධීක්ෂණයට යොමු කර ඇති අය සහ ඔක්කොම එකතු වෙලා වැඩ කරන බැවින් සහ එවිට උප සභාපතිතුමා පැවසූ පරිදි එම අයගේ යාළුමිත්‍රකම් එක්ක සාමාන්‍යයෙන් පොඩි වැරැද්දක් කරනකොටවත් ඒක පෙන්වලා දෙන්න අමාරු තත්ත්වයකට ඒගොල්ලෝ පත්වෙලා සිටින බවත්, ඔක්කොම එකතු වෙලා හවසට අඩියක් ගහනවා, ඒ වගේ තත්ත්වයක් ඇතිවෙන බවත්, ඒ නිසා සතියෙන් සතිය හැම අංශයම, වැඩකොටසම නිරීක්ෂණය කිරීමට අංශ ප්‍රධානීන්, සභාපතිතුමාගේ යුතුකමක් තිබෙන බවත්,ඒක වැදගත් බවත්, එවිට එම පිරිස

සභාපතිතුමා සතියෙන් සතියෙන් ඇවිල්ලා මේ ස්ටොක් එක බලනවා යන්න පිළිබඳ දැනුවත් වන බවත්, එබැවින් ගරු සභාපතිතුමාගේ අධීක්ෂණය වැදගත් බවත්, එබැවින් ඒ කටයුත්ත සභාපතිතුමා අද සිටම පටන් ගත යුතු බවත්, එවිට සභාපතිතුමාට මේ වැඩ කටයුතු සාර්ථකව කරගෙන යන්න පුළුවන් බවත් පවසමින් දීර්ඝව අදහස් දක්වන ලදී.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ ඉහත කතාව ඇත්ත බවත්, සෞඛ්‍ය අංශයේ අමතර ට්‍රැක්ටරයක් ගන්න සති දෙකක සිට උත්සාහ කරන බවත්, මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා දැනුවත් කළ බවත්, අද උදේ ඇවිත් ට්‍රැක්ටරේ බලනකොට ට්‍රැක්ටරේ ඔයිල් බිංදුවක් නැති බවත්, එන්ජින් ඔයිල් ගියර් ඔයිලුත් නැති බවත්, රියදුරු එයා ඊයේ දිව්වෙත් එහෙමලු කියන බවත්, අද ට්‍රැක්ටරය අරන් යන්න එපාකිවූ බවත්,එම තත්වයෙන් අරන් ගියාට පස්සේ ඇන්ජිම පාරේ නවතින බවත්, එසේ කලේ නැතිනම් අද ට්‍රැක්ටරය අරන් යන බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ එවැනි අඩුපාඩු සිදු විය නොහැකි බවයි. ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා නැවතත් අදහස් දක්වමින් වගකිවයුතු අය වගකිවයුතු බවත්, අනුන්ගේ පව් ගෙවන්න බැරි බවත්, රියදුරා වුණත් වගකියන්න ඕනි බවත්, හැමදාම උදේ පාන්දර බලන්වානම් එලෙස වෙන්නේ නැති බවත්, සියළුදෙනා තමන්ගේ වගකීම හරියට ඉෂ්ට කළ යුතු බවත්,8556 කියන්නේ මේ නගර සභාවේ තියෙන හොඳම ට්‍රැක්ටරය බවත්, එය මීට කලින් වැඩ කලේ ඒ.එන්. ජයසිංහ යන සභාවේ සිටි හොඳ රියදුරෙක් බවත්, හැබැයි අද එහි ඔයිල්, ඇන්ජින් ඔයිලුත්, ගියර් ඔයිලුත් නැති බවත්, තමන් අද පැමිණියේ නැත්නම් මේ තත්වයෙන් ට්‍රැක්ටරේ අරගෙන යන බවත්, එබැවින් මෙහෙම වෙන්න දෙන්න බැරි බවත්, මේකට කවුරුහරි රියදුරු මහත්මයා හෝ නිලධාරියා වගකිව යුතු බවත්,හැමදාම සභාවේ මන්ත්‍රීවරු මේ පිළිබඳව විවාද කරන බවත්, එම වියදම් වැඩිවීම්වලට හේතුවක් පවතින බවත්, මේ අනුව හේතු ජේන බවත් ,මෙම ගැටළු නිරාකරණය කළ යුතු බවත් පවසන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් වාහන සම්බන්ධව සෘජු නිලධාරියෙක් ඒ සඳහා යොමු කිරීමට හැකියාව පවතීද යන්න විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ වාහන සම්බන්ධයෙන් වැඩ අධිකාරී මහතා බලන බවයි.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ වැඩ අධිකාරී මහතාගේ වැරදි කියනවා නොව එතුමා ඉදිරි සතියේ සිට තව ප්‍රාදේශීය සභා දෙකක වැඩ බලන බවත්, එතකොට එතුමාට මේක කරන්න වෙලාවක් වෙන්නේ නැති බවත්, ඒක එතුමාගේ වැරැද්දක් නොව කොමසාරිස්තුමා එතුමා ප්‍රාදේශීය සභා දෙකක වැඩ ආවරණය කිරීමට පත් කර ඇති බවත්, එවිට එතුමාට නගර සභාව සහ ප්‍රාදේශීය සභා තුනක වැඩ ආවරණය හේතුවෙන් මෙම ආයතනයේ අඩුපාඩු සිදු වන බවත්, එයට සභාවෙන් කුමක් හෝ ක්‍රමයක් සාදාගත යුතු බවත්ය.

මෙහිදී වැඩ අධිකාරි මහතා අපි ආරක්ෂා කරගත යුතු බවත්, මෙම නගර සභාව කියන්නේ සුන්දර නගර සභාවක් බවත්, නගර සභාවේ වැඩ කටයුතු සාර්ථකව කරගෙන යනවා නම් එතුමා දවස් පහම අපි ළඟ තියාගන්න ඕනි බවත්, ඒ සම්බන්ධව සභාපතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරු හරහා, ආණ්ඩුකාරතුමිය හරහා ක්‍රියාත්මක විය යුතු බවත්, ලේකම්තුමා හෝ කොමසාරිස්තුමා කියන කියන විදිහට අපේ වැඩ අධිකාරි මහතා ගණකාධිකාරීතුමිය වැනි නිලධාරී කණ්ඩායම් මෙලෙස යොමු කිරීමෙන් අපි අසාර්ථක වෙන බවත්, එතකොට සියලුම චෝදනා ලැයිස්තු එන්නේ නගර සභාවට බවත්, දැන් මන්ත්‍රීවරුත් චෝදනා කරන්නේ වැඩ අධිකාරි මහතාට බවත්, මන්ත්‍රීවරු කියනවා එතුමා වැඩ කරන්නේ නැහැ කියලා නමුත් එතුමා කොහොමද වැඩ කරන්නේ යන්නත්, එතුමා ප්‍රාදේශීය සභාවල ගැටලු, ආයතන තුනක ගැටලු බලනකොට එතුමාට මානසිකත්වයක් නැති බවත්, මේකම නගර සභාවට වගේම ප්‍රාදේශීය සභාවටත් ගැටලුවක් වෙන බවත්, එම නිසා සභාපතිතුමාගේ යුතුකමක් තියෙනවා ආණ්ඩුකාරතුමිය සභාපතිතුමාගේ පක්ෂයේ බැවින් එමෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සිටින බැවින් සාකච්ඡා කළ හැකි බවත්, ඒ නිසා මේ නගර සභාව ආරක්ෂා කිරීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා ලබා ගත්තා වගේ මෙතුමාව ආරක්ෂා කරලා අපේ නගර සභාවට ලබාදෙන්න කියලා ඉල්ලීමක් කරන ලෙසත්, සභාපතිතුමා වැඩ අධිකාරි මහතාව නිදහස් නොකර සිටින ලෙසත්, සභාපතිතුමාගේ බලය පිළිබඳව සභාපතිතුමා දැනගන්න ඕනි බවත්, සභාපතිතුමා ආණ්ඩුකාරතුමිය නැත්නම් කොමසාරිස්තුමා කියන කියන පදයට නටන්න එපා යන්නත්, සභාපතිවරයෙකුට තියෙන බලය පිළිබඳව චක්‍රලේඛ කියවා ලබන ලෙසත්, සභාපතිතුමා එම බලය පාවිච්චි කරන ලෙසත්,සභාපතිතුමාව පත් කරලා තියෙන්නේ මේ බළන්ගොඩ ජනතාව වෙනුවෙන් බවත්, ඒ නිසා ජනතාව ආරක්ෂා කිරීම සඳහා නිලධාරීන් ආරක්ෂා කරගන්නා ලෙසත්, සභාපතිතුමා කියන කියන විදිහට එහාට මෙහාට නිලධාරි නොදෙන ලෙසත්, නගර සභාවේ රාජකාරී වැඩි බවත්, නගර සභාවක් යනු පිරිසිදුකම රැකගතයුතු ආයතනයක් බැවින් සභාවෙන් මෙතුමාව නිදහස් කිරීමට නොහැකි බව දන්වන ලෙසත්,සභාපතිතුමාගේ බලය ඉතා වැදගත් ලෙස භාවිතා කරන ලෙසත් එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා පැවසුයේ වැඩ අධිකාරි මහතා කාර්යබහුල බැවින් වාහන කැඩෙන බිඳෙන තරමට ඒවා අධීක්ෂණය කිරීම වෙනුවෙන් අනිවාර්යෙන් නිලධාරියෙකු පත්කළ යුතු බවයි. වැඩ අධිකාරි මහතාගේ අධීක්ෂණය යටතේ නිලධාරියෙකු වාහන සම්බන්ධයෙන් කටයුතු කිරීමට පත්කළ යුතු බව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස්.චන්දන මැතිතුමා පැවසීය.

අනතුරුව ගරු සභාපතිතුමා පැවසුයේ වැඩ අධිකාරි මහතා පූර්ණකාලීනව මෙම සභාවට යෙදවීම සඳහා ඉල්ලීමක් යොමු කරන බවයි.ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා සඳහන් කලේ එතුමා වෙත මෙම සභාවෙන් වැටුප් ගෙවන බැවින් එතුමා නිදහස් නොකරන

ලෙසයි.ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා පැවසුයේ අනිත් සභාවලට නිදහස් කරන්න බැරි බව ගරු සභාපතිතුමා පවසන ලෙසත්, අද දින සභාවේදී වැඩ අධිකාරි මහතා දවස් පහම මෙහි තියාගන්නවා කියලා යෝජනාවක් ඉදිරිපත් කර සම්මත වූ බව සම්බන්ධීකරණ කමිටුව වෙත පවසන ලෙසත්ය.

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය පැවසුයේ ගණකාධිකාරිතුමියද මෙහි වැඩ බලන බවයි.ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා, ගණකාධිකාරිතුමිය කලාප කාර්යාලයේ ස්ථිර බවත්, මෙහි වැඩ බලන බවත්, නමුත් වැඩ අධිකාරිතුමා මෙහි ස්ථිර බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පැවසුයේ වාහන සම්බන්ධ කටයුතු අධීක්ෂණය වෙනුවෙන් වැඩ අධිකාරි මහතා හෝ කාර්මික නිලධාරි මහතා පත් කලද, ඇත්තටම රියදුරුට වාහනේ ගැන තමන්ට වගකීමක් පවතින බවත්, තමනුත් වාහන පදින බවත්, තමන් පදින වාහනේ අවශ්‍ය දේවල් බලන්න බැරි නම්, ඔයිල් ටික බලන්න බැරි නම්, ඒ වෘත්තිය පිළිබඳව එම පුද්ගලයාට ඕනෑකමක් නැති බවත්, ඇත්තටම ඒ වගේ වෘත්තිය පිළිබඳ ඕනෑකමක් නැති මිනිස්සු මෙහි සිටින බැවින්, හිටපු සභාපතිතුමාලා 'දැන් clean sri lankaද ' කියලා කියන බවත්, එහෙම අහන්න වෙලා තියෙන්නේ තමන් ඇතුළු කණ්ඩායමේ වැරැද්දක් නිසා නොවන බවත්, මෙහි එම වැරදි කරන අයට ඒ වැඩේ කරන්න කියලා අතදෙන්නේ නැති බවත්, නමුත් මෙම අය මෙහි කලින් පාලනය අස්සේ කොහොමත්, ඔක්කොම එකතු වෙලා මේක කර බවත්, දැන් මේකේ එක පැත්තක් නැති බවත්, නමුත් අනිත් පැත්තේ ඒ විදිහටම යන බවත්, නමුත් ඒක දැන් අපිට ප්‍රශ්නයක් බවත්, මෙහි මන්ත්‍රීකමක් අරගෙන ඇවිත් කැත කතා අහගන්න ඕනේ නැති බවත්ය.

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් මෙහි යට ඉන්න කම්කරුවාගේ සිටම මේක clean කරන්නම සිදු වෙන බවත්, එහෙම නැති වුණොත්, ලොකු අමාරුවක වැටෙන බවත්, අපි මේක ඇත්තටම කරන්න ආවේ හදවතින්ම බවත්, අපි වෙනසක් කිරීමට ආව බවත්, නමුත් ඒ වෙනස අවුරුද්දක් තිස්සේ අපි ඇවිල්ලා මේක දකින්න බැරි වෙලා තියෙන බවත්, ඒක ලොකු ප්‍රශ්නයක් බවත්, මේ වෙනස කරන්න බැරි නම් අපි හැමදාම මේ සභාවට ඇවිල්ලා බොරු කතා කියලා වැඩක් නැති බව දිගින් දිගටම කියන බවත්, හැමදාම එක එක කෙනා යෝජනා කරනවා, හැබැයි යෝජනා කරාට එකක්වත් වෙන්නේ නැති බවත්,මේකේ ඊට යටින් තියෙන හස්තය කුමක්ද යන්නත් පවසන ලදී.

මෙම අවස්ථාවේ එතුමාගේ ඉහත කතාවට සභාවේ අත්පොළසන් දෙන ලදී.අනතුරුව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් මෙතන අවුලක් ඉස්සර තිබුණ බවත්, මෙතන අවුලක් තිබුණු නිසා අදටත් නිලධාරීන් අපහසුතාවයට පත්වෙලා තිබෙන බවත්, නමුත් දැන් මෙතන නිවැරදි වෙලා තිබෙන බවත්, මොකද ඉස්සර නිලධාරීන්ට නොයෙකුත් චක්‍රලේඛ නියෝග

දෙන්නේ මෙතන දේශපාලන අධිකාරිය වැරදි නිසා, ඒගොල්ලන්ගේ වෙන වැරැද්ද නවත්තන්න නියෝග නිකුත් කරන බවත්, ඉතින් ඉස්සර මෙතන අය වැරදි වෙනකොට, මෙතන අය වරද්දනකොට නිලධාරීනුත් ඒ වැරැද්දටම ගිහිල්ලා අද වෙනකොට නිලධාරීනුත් අපහසුතාවයට පත්වෙලා තිබෙන බවත්, නමුත් අද වන විට සිදු වී ඇත්තේ මෙතන නිවැරදි නමුත් නිලධාරීන් තාමත් අර නියෝග පිටම සිටින බවත්, හොරකම් කරනවා කියලා කියන්නේ නැති නමුත් වැඩ ප්‍රමාදය වගේ දැනෙන්නේ ඒ නිසා බවත්, මෙතන දේශපාලන අධිකාරිය දැන් නිවැරදි වී සිටින බැවින් වැඩ කරන්න බය වෙන්න ඕනේ නැති බව නිලධාරීන්ගෙනුත් ඉල්ලන බවත්, ගොඩක් වෙලාවට ඉස්සර දේශපාලන අධිකාරිය වැරදි බව දැන දැන ඒගොල්ලොත් එක්ක ගිහිල්ලා වැරදි වැඩ ඔක්කොම කරන අය ඉඳලා තියෙන නමුත් දැන් මෙතන නිවැරදි වෙලා තියෙන නිසා බය නැතුව වැඩ කරන්න හැකියාව පවතින බවත්, තමන් ඒ සම්බන්ධයෙන් පෙනී සිටින බවත්, එබැවින් සියළු දෙනා එක්ව වැඩ කරමු යන්නත්, කියන අවලාද ආදිය අපිට නැති කරගැනීමට හැකියාව පවතින බවත්ය.

මෙම අවස්ථාවේ ගරු සභාපතිතුමා ප.ව.12.30ට මුදල් කාරක සභාවේ ටෙන්ඩර්පත් විවෘත කිරීම සඳහා මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් පසුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**07:01:09** 2026.04.22 දින පැවති මුදල් කාරක සභාවේදී ZA -5326 මොටර් ග්‍රේඩරය වෙනත් ආයතන සඳහා කුලී පදනම මත ලබාදීම සඳහා යෝජනා වූ බැවින් ඒ සම්බන්ධව ඉදිරි කටයුතු තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිද ගරු සභාපතිතුමා පැවසුයේ සභාව සතු මෝටර් ග්‍රේඩරය ආදායම් උත්පාදනයක් සිදු නොවන බැවින් කුලියට ලබා දීම සුදුසු බවට මුදල් කාරක සභාවේදී සාකච්ඡා වූ බවත්, ඒ අනුව කුලියට ලබා දෙනු ලබන ආකාරය පිළිබඳව තීරණය කළ යුතු බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ජේ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ විවෘත මිල කැඳවීමක් කර මේ සඳහා කුලී පදනම මත ටෙන්ඩර්කරුවෙකු වෙත ලබා දිම සුදුසු බවයි.ගරු සභාපතිතුමා පැවසුයේ වසරක කාලයක් සඳහා ටෙන්ඩර් ලබා දීම සුදුසු බවයි.

මෝටර් ග්‍රේඩර්,ජේ.සී.බී වැනි යන්ත්‍ර සඳහා සාමාන්‍යයෙන් වැඩ කරන පැය ගණනට අයකරන බව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පවසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ පැය ගණනට අයකිරීම් සිදු කරනු ලබන්නේ කුලියට ලබා දීමේදී බවත්, මෙහි අදහස් කරන්නේ ටෙන්ඩර් වශයෙන් ලබා දීම බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ මෙය තාක්ෂණික ඇගයීම් කමිටුවක් වෙත යොමුකර එයින් නිර්දේශ ලබාගෙන ටෙන්ඩර් කිරීම සුදුසු බවත්, ඒ අනුව පැය ගණනට අයකරන්නේද නැතිනම් මාස ගණනට අයකරන්නේද යන්න පිළිබඳව තීරණය කළ යුතු බවයි.

කර්මාන්ත කාරක සභාව පැවතියේ නම් එහිදී මෙම කරුණු පිළිබඳව සාකච්ඡා කර මෙතනට පැමිණෙන බවත්, නමුත් දැන් මාස ගණනක් ගත වුවද කර්මාන්ත කාරක සභාව නොපැවැත්වූ බවත්, කරුණාකර කමිටු ක්‍රියාත්මක කරන ලෙසත්, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි පවසන ලදී.

ගරු උප සභාපති නදිශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ ඉහත කාරණය පිළිබඳව සාකච්ඡා වූයේ මුදල් කාරක සභාවේදී බවත්,එහිදී මෙම යන්ත්‍රය ඵලදායි ලෙස යොදා ගැනීමට සහ ආදායම් උත්පාදනය වෙනුවෙන් කුලියට ලබා දීම පිළිබඳ ඉහත යෝජනාව ඉදිරිපත් වූ බවත්, ඒ අනුව ඉහත මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි තාක්ෂණික ඇගයීම් කමිටුවක් වෙත යොමුකර එහි නිර්දේශ අනුව තීරණය කිරීම සුදුසු වන බවයි.මෙවැනි වාහන ලබා දිමේදී ඒවා ටෙන්ඩර් ලබාගන්නේ කුමක් හෝ කොන්ත්‍රාත් කරන ආයතනයක් බවත්, එහිදී සභාවට අවම වශයෙන් දිනකට ලැබිය යුතු ආදායම පිළිබඳව සඳහන් කල යුතු බවත්, එහිදී සාධාරණ ගණනය කිරීම් ක්‍රමවේදයක් වැඩ අධිකාරි මහතා සාදා දෙනු ඇති බවත්, එසේ නොමැතිව එය අපට අවශ්‍ය පරිදි ගණනය කළ නොහැකි බවත්, ඒවා ලබා දෙන ක්‍රමවේදයක් තිබිය යුතු බවත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පවසන ලදී.

මෙහිදී යන්ත්‍රය අවුරුද්දකට කුලියට දුන්නොත් දවසකට පැයක් වැඩ කරයි එවිට එයට වගකියන්නේ කව්ද යන්නත්, එය ලබා දෙන ක්‍රමවේදය පිළිබඳව හරියට සාකච්ඡා කළ යුතු බවත් ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා පැවසීය.අනතුරුව ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා පැවසුයේ මෙහිදී කතාව දිග්ගස්සාගන්න අවශ්‍ය නැති බවත්, හර්ෂණ මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට මෙය තාක්ෂණික ඇගයීම් කමිටුවක් වෙත යොමුකර එහි නිර්දේශ අනුව ඉදිරි කටයුතු තීරණය කිරීම සුදුසු වන බවත්ය.

ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත මෝටර් ග්‍රේඩරය කුලියට ලබාදීම වෙනුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවක් වෙත යොමුකිරීම සුදුසු බවට ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**07:01:10** බළන්ගොඩ නගර සභා සීමාව තුළ වරිපනම් අයකර ගැනීම සඳහා 2018 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුව මගින් නව තක්සේරුවක් සිදු කර එම ලේඛන 2020 වර්ෂයේ දී නගර සභාව වෙත භාර දී ඇත.නමුත් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අංක ACLG 09/04 හා 2020.07 දින රහිත ලිපිය මගින් දන්වා ඇත්තේ අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව 2020 පැවති කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ආර්ථිකයට සිදු වූ බලපෑම සැලකිල්ලට ගෙන වසර දෙකක් යන තෙක් තවදුරටත් වරිපනම් බදු ප්‍රතිශත නොවෙනස්ව පවත්වාගෙන යන ලෙසයි.

2023 වර්ෂයේ සිට නව තක්සේරුව මත වරිපනම් බදු පැනවීම/අයකිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමේදී 2024.01.01 දින සිට නව තක්සේරුව ක්‍රියාත්මක කිරීමට අනුමැතිය හිමි වූ අතර දැනට එය ක්‍රියාත්මක වේ.

එසේ වුවද 1946 අංක30 දරණ වරිපනම් හා තක්සේරු පනතේ 20 වන වගන්තිය අනුව වරිපනම් දේපළ වසර 5 කට වරක් තක්සේරු කල යුතු බව සඳහන් කර ඇත. බළන්ගොඩ නගර සභාවේ දැනට ක්‍රියාත්මක තක්සේරු වාර්තාව 2020 වර්ෂයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් සිදු කර ලබා දී ඇති වාර්තාව වන අතර එම තක්සේරුව සඳහා දැනට වසර 5ක කාලයක් ගතවී ඇති බැවින් නැවත 2026 වසරේ තක්සේරුවක් සිදු කිරීම පිළිබඳව තීරණය කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ඉහත යෝජනාව පිළිබඳව අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.ඒච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ 1946 අංක30 දරණ වරිපනම් හා තක්සේරු පනත අනුව වරිපනම් දේපළ වසර 5 කට වරක් තක්සේරු කල යුතු බව දැක්වුවද 2022 කොවිඩ් වසංගතය හේතුවෙන් 2023 තක්සේරුව 2024 සිට ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුකාරතුමා අනුමැතිය ලබා දි ඇති බවත්, ඒ අනුව බලන විට නව තක්සේරුවක් ක්‍රියාත්මක කර තවම වන්නේ අවුරුදු දෙකක් පමණක් බවත්, පසුගිය වසරේත් වැඩි කල බවත්,එය මිනිසුන්ට දරාගන්න බැරි බවත්, පනතේ තියෙනවා කියලා අවුරුදු දෙකක් යන්න කලින් ආපසු වැඩි කිරීමේදී මිනිස්සු ව්‍යාපාරයක් කරන්නේ කොහොමද යන්නත්, මේ වන විට විදුලි බිල,ජල බිල ආදි සියල්ලමද වැඩිවී ඇති බැවින් මෙය වැඩි කිරීමට පෙර ව්‍යාපාරිකයන්ගේ පැත්තෙනුත් සලකා බැලීමට මෙම අවස්ථාවේ තමන් යෝජනා කරන බවත් පවසන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ ඉහත ඉල්ලීම් කරනුයේ තක්සේරු කිරීමට පමණක් බවත්, එය ක්‍රියාත්මක කිරීමට නොවන බවත්, එම තක්සේරුව ලැබෙන විට 2029 පමණ වනු ඇති බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත පරිදි 2026 වසරේ තක්සේරුවක් සිදු කිරීමේ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:11** 2026 මාර්තු මස දෛනික වැටුප් වෙනුවෙන් රු.1,855,490.19 ක් ගෙවීම වෙනුවෙන් ආවරණ අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් තමන් මෙහිදී නැගිටින්නේ ඇයිද යන්න සභාපතිතුමා දන්නා බවත්, කලින් තමන් පෙන්වා දුන් කරුණ සම්බන්ධව සඳහන් කළ සමරදාස යන පුද්ගලයා දරුවන් දෙදෙනෙකු සිටින ඉතාමත් අහිංසක පුද්ගලයෙක් බවත්, හාට් ඇටෙක් එකක් ඇවිත් එම කරුණු සියල්ලම තමන් දන්නා බවත්, නමුත් මෙහිදි අපි කතා කරන්නේ මූල්‍ය කළමණාකරණය පිළිබඳව බවත්, දැනට රියදුරන් 04 දෙනෙකුගේත්, කාර්යාල කාර්ය සහායක 03දෙනෙකුගේ මෙන්ම මුරකරු පුරප්පාඩුත් පවතින පවතින බවත්, ඒ අනුව ඉහත දෛනික වැටුප් මුදල ගෙවන්නේ එම පුරප්පාඩු තනතුරු සඳහානම් තමන් අත් දෙකම ඔසවා තම සහයෝගය ලබා දෙන බවත්, නමුත් මෙහි සිදුවන්නේ එය නොවන බවත්, මෙහි සෞඛ්‍ය කම්කරුවන් දැනට 22ක් සිටින බවත්, වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 15 දෙනෙකු සිටින බවත්, එම සේවකයන් තමන්ගේ රාජකාරිය නොව වෙනත් රාජකාරිවල යෙදෙන බවත්, සෞඛ්‍ය කම්කරුවානම් සෞඛ්‍ය සම්බන්ධ රාජකාරිවල යෙදිය යුතු බවත්, මාර්ග කම්කරුවා සිටිය යුත්තේ මාර්ග සම්බන්ධ කටයුතු වල බවත් තනතුරු නාමයෙන්ම පැහැදිලි කරලා තියෙන බවත්, නමුත් මෙහි එම නඩත්තු කටයුතු කිසිදෙයක් සිදු නොවන බවත්, කරපු ඒවා ඔක්කොම සති දෙකෙන් තුනෙන් ගලවගෙන ගිහින් තිබෙන බවත්, මෙතරම් මුදලක් ගෙවන්නේ කුමකටද යන්න ගරු සභාපතිතුමා තේරුම් ගත යුතු බවත්, මොකද සභාපතිතුමා මෙම ප්‍රදේශයේ වැදගත් ලෙස අධ්‍යාපනය ලැබූ පුද්ගලයෙක් බැවින් එතුමාට කාටත් වඩා හොඳට මේ පිළිබඳව තේරුම් ගත හැකි බවත් පවසන ලදී.

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසුයේ සාමාන්‍යයෙන් මාසෙකට දවස් තියෙන්නේ 30,31 හෝ 28 බවත්, මෙහි පුද්ගලයෙක් දවස් 35 ක් වැඩ කර ඇති බවත්, ඒකට මොකක්ද හේතුව යන්න නොදන්නා බවත්, එමෙන්ම මෙහි මුරකරු නිවාඩු ගිහිල්ලානම් එළියෙන් ඒකට ශ්‍රමය මිලදි ගන්නා බවත්,කළමණාකරණයේ දුර්වලතාවය කෙසේද කියනවානම් මුරකරු නිවාඩු ගියවිට සෞඛ්‍ය කම්කරුවෙක් හෝ මාර්ග නඩත්තු කම්කරුවෙක් හෝ දමා මුරසේවය ක්‍රියාත්මක කරගන්න බැරිව ඒක පිටින් මිලදී ගන්නවා නම් ඇති වැඩේ මොකක්ද යන්නත්, මූල්‍ය කළමනාකරණය සම්පූර්ණයෙන්ම බිංදුවට වැටී ඇති බවත්,

ඉහත සමරදාස යන පුද්ගලයාගේ, 2026 අප්‍රේල් මාසයේ ඔහුගේ වැටුප රුපියල් 19,000 ක් ලෙස සටහන් කර තිබුනද ඔහුගේ අතට ලැබිලා තියෙන්නේ රු.6,138 ක් බවයි.ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා එම අඩුකිරීම කර ඇත්තේ ණයක් සඳහා බව පැවසීමත් සමඟ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ ණයක් කැපුණා නම්, ණය කැපීම මෙතන පෙන්නන්න ඕනි බවත්, හරියට මූල්‍ය කළමනාකරණය කරගන්න බැරුව මේ විදිහට යනවා නම් වැඩක් නැති බවත්, ඒවගේම පසුගිය ආණ්ඩුවලින් මොනවා හරි දෙයක් කරලා ඔවුන් දී ඇත්තේ පත්වීමක් බවත්, එහි ඔවුන්ට වගකීමක් දී ඇති බවත්, තමන්ගේ තනතුරු නාමය අනුව තමන් ඉන්නේ මෙන්න මේ තනතුරේ කියලා එම සේවකයන් දන්නා බවත්, ඒ තනතුරේ වැඩ කරන්නේ නැතුව, මෙතන ඇවිල්ලා වෙන වෙන ඒවා කරන්න ගියාම බැරි බවත්ය.

එතුමා තවදුරටත් පැවසූයේ තමන් එයට සම්පූර්ණ විරුද්ධ බවත්, මෙම ක්‍රමවේදය මෙතනින් හරි නවතින්න ඕනි බවත්, අනිත් ඕනෑම අයෙකුට මෙය සම්මත කරගත හැකි බවත්, තමන්ට මේවා සම්මත කරගන්න බැරි බවත්, ලේකම්තුමියට අධිහාර වී පැමිණ ඇති බවත්, සභාපතිතුමා හොඳාකාරවම දන්නා බවත්, එතකොට මේකේ සම්පූර්ණ වගකීම එන්නේ මේවාට බලය දුන්න අපිට බවත්, තමන් රජයේ සේවකයෙක් බැවින් මේවාට ගෙවන්න හැකියාවක් නැති බවත්, ඕනෑම කෙනෙකුට තමන්ගේ මතය ප්‍රකාශ කරලා මේක සම්මත කරගන්න හරි ඕනෑ දෙයක් කර ගත හැකි බවත්, කොම්පෝස්ට් එකේ කුණු එකතු කරන්නේ නැත්තම් එය වෙනම බලන ලෙසත්, මෙම කසළ එකතු කිරීම්වලට ලක්ෂ ගණන් මාසිකව මුදල් ගෙවන බවත්, කළ යුත්තේ කොම්පෝස්ට් අංගනයේ කටයුතු කළමණාකරණය කර ගැනීම බවත්, මෙතන පුරප්පාඩු වන රියදුරු තනතුරු 04 හෝ කාර්යාල සහායක තනතුරු සඳහා හෝ මෙහි ඇති අඩුපාඩුවට එළියෙන් ශ්‍රමය මිලදී ගෙන තියෙනවා නම්, තමන්ගේ කැමැත්ත ප්‍රකාශ කරන බවත්,නමුත් තමන් මෙයට සම්පූර්ණ විරුද්ධ බවත්, ඒ අනුව පනත ප්‍රකාරව විරුද්ධ වුවහොත් සභාපතිතුමා බෙදීමක් ලබා දිය යුතු බැවින් මෙම අවස්ථාවේ බෙදීමක් යෝජනා කරන බවත්ය.ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් එකී යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් ඉහත හර්ෂණ මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය නිවරදි බවත්, මෙය බැහැර කළ යුතු කාරණාවක් නොවන බවත්, මානව සම්පත කළමණාකරණය නිසි පරිදි සිදු විය යුතු බවත් පැවසූ අතර මෙම සෞඛ්‍ය කම්කරුවන් වෙනත් රාජකාරිවල යොදවා ඇති ආකාරය පිළිබඳව පැහැදිලි කිරීමක්ද කරන ලදී.නමුත් ගැටළුව වී ඇත්තේ මෙය නොව මෙම පිරිස කුමක් හෝ රාජකාරියක් ආවරණය කරන බවත්, එසේ ආවරණය කරන්නේද සභාවේ පවතින කුමක් හෝ පුරප්පාඩුවක් බවත්, මෙම පිරිස මෙසේ රාජකාරි ආවරණය කරද්දී දෛනික වැටුප් වලට ශ්‍රමය පිටතින් මිලදි ගන්නා බවත්, නමුත් එම පිටින් ගන්නා පිරිසගේ වැඩ ඉතාම දුර්වල බවත්, එම

සේවකයන්ගෙන් වියදම්කරන වැටුපට සරිලන සේවයක් සිදු නොවන බවත්, දෛනික වාර්තාවේ නිසි පරිදි වැඩ සටහන් නොවන බවත්, අධීක්ෂණයක් සිදු නොවන බවත්,ක්ෂේත්‍රයේ වැඩ කරන කම්කරුවා, විදුලි කාර්මික අද වැඩ කරන්නේ කොහෙද කියලවත් දන්නේ නැති බවත්, අනතුරක් වුවත් වගකියන්නේ කව්ද යන්නත්, මේවා නිවරදි විය යුතු බවත්, වගකිවයුත්තෙක් සිටිය යුතු බවත්, මෙම කියන ආකාරයේ චෝදනා සියල්ලම ඇත්තටම සිදු වන බවත්, එබැවින් එම අඩුපාඩු තිබියදී ඊළඟ සභා වාරයේදී මෙම දෛනික වැටුප් ගෙවීම අනුමත වෙන්නේ නැති බවත්, අනිවාර්යෙන් එම අඩුපාඩු නිවරදි විය යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා පැවසුයේ දැන් සිදුවී ඇති තත්වයත් සමඟ අතිකාල ආදිය කප්පාදු කරමින් යන බවත්, මාර්තු මාසයේ ඇත්තේ දින 31ක් බවත්, මෙම දෛනික වැටුප් වාර්තාව අනුව එක් පුද්ගලයෙකුට දින 35ක් සඳහා වැටුප් ගෙවා ඇති බවත්, එලෙස දින ගණන් සැදේන්නේ කෙලෙසද යන්න පිළිබඳව අපැහැදිලිතාවයක් පවතින බවත්, එමෙන්ම කොම්පෝස්ට් අංගනයේ සේවකයන් පස් දෙනෙකුට තවමත් ගෙවන්නේ පැරණි වැටුප බැවින් දෛනික වැටුප අවම රු.200කින්වත් වැඩිකිරීමේ හැකියාවක් පවතිනම් එය සිදු කිරීමට යෝජනා කරන බවත්, මෙලෙස දින 35ක් වැඩ කරන අයට සම්මාන දිය යුතු මිනිස්සු වුවද එම සේවකයන්ගෙන් බලාපොරොත්තු වන සේවාව ඉටු වී නොමැති බවත්, ඒ අනුව එම දින 35 පිළිබඳ පැහැදිලිකිරීමක් සිදු කරන ලෙසත්ය.

එම සේවකයන් වැඩ දෙකක් කර එලෙස දින 35ක් ලෙසට දක්වා ඇති බව ගරු සභාපතිතුමා පැවසූ අතර ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ කම්කරු පනත අනුව එසේ පැය 24ක් වැඩ කිරීමට නොහැකි බවයි.ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ එලෙස වැඩ කර ඇත්නම් එය අතිකාල දීමනාවක් ලෙස ගෙවීම් කළ යුතු බවයි.

මෙම කම්කරුවන් කිසිඳු අයෙකු සමඟ කිසිඳු පෞද්ගලික තරහක් නැති බවත්, එම සේවකයන් අපේ සේවකයන් බවත්, නමුත් මෙහි සේවයට යෙදවීම පිළිබඳ ගැටළු ඇති වී ඇති බවත්, ඉහත ගරු මන්ත්‍රීතුමන්ලා දැක්වූ පරිදි දින 35ක් වැඩ කිරීම පිළිබඳව පැහැදිලි කිරීමක් ලබා දෙන ලෙසත් ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පැවසීය.

මෙහිදී ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඉහත කරුණ පිළිබඳව පැහැදිලිකිරීමක් වෙනුවෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්ළ අතර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා එම දින ගණන්හි සේවයේ යෙදවීම පිළිබඳ පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සබාව මහ සභාව බවට පත් කරන ලදී.

මෙම ලබා ගන්නා තීරණය පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමිය දැනුවත් කරන ලෙසත් එය කඩිනම්ව ඉදිරිපත් කරන ලෙසත් ඒ පිළිබඳව විශේෂ ඉල්ලීමක් යොමු කරන ලෙසත් මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසීය. එමෙන්ම මෙහි පසු විපරම බිංදුවයි බවත්, 2025.12.05 වැනිදා සභාවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත මැනුම් ඉල්ලීමක් සම්බන්ධව ලිපියක් ඉදිරිපත් කර ඇති බවත්, ඇමතුම් දිනපොත අනුව රාජය නිලධාරින් පසු විපරමක් තබාගත යුතු බවත්, තමන් ඉහත යෝජනාවට සම්පූර්ණ විරුද්ධ වන බැවින් බෙදීම ලබා දෙන ලෙස එතුමා නැවතත් පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා පැවසූයේ ඉහත මන්ත්‍රීතුමා පවසන කතාව අනුව බැලූ විට දෛනික වැටුප් ගෙවීම වෙනුවෙන් අනුමැතිය ලබා දිය නොහැකි බවත්, නමුත් මෙවර ඉදරිපත් කර ඇත්තේ ආවරණ අනුමැතිය ලබා ගැනීම සඳහා බැවින් පක්ෂව ඡන්දය ලබා දෙනු ලබන බවත්, ඊළඟවර තම ඡන්දය බලාපොරෙත්තු නොවන ලෙසත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා සඳහන් කලේ මේ සම්බන්ධව වෙනම වැඩසටහනක්ද පැවැත්වූ බවත්, එබැවින් දැන දැන ගොස් අමාරුවේ වැටිය නොහැකි බවත්,මෙහි සිටින විට නිවරදි තීරණ ගත යුතු බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා, තමන් මෙලෙස විමසන්නේ දැනගැනීමට බවත්, මෙම ගෙවීම එදා සිටම ගෙවීම්කර බවත්,ඒ අනුව ආණ්ඩුකාරතුමිය කොමසාරිස්තුමා ,විගණනනය මෙම ගෙවීම පිළිබඳ දන්නේ නැද්ද යන්නත් විමසන ලදුව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ මෙය විගණනයට ලක්වී ඇති බවයි. ඒ අනුව නැවතත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසූයේ එම විගණනය මඟින් දැක්වූ නිර්ණායකය කුමක්ද යන්නත්, මෙහිදී විරුද්ධ වෙන්නත් ඕනි,නොගෙවා සිටීමටත් බැරි බවත්, ඒ අනුව මෙහිදී අසරණ වන බවත්, මෙහි සිටින නිලධාරීන්ගේ මූණ බලාගෙන අනිත් පැත්තට ඡන්දය දෙන්නේ කොහොමද යන්නත්,තමන්ද මෙතන මනුස්සයෝ බවත්, ඒ පිරිස ගන්න පඩියට වඩා දහස් ගුණයක් වැඩ කරන මිනිස්සු බවත්, ඒ දිහා බල බල හෘද සාක්ෂියට එකඟව විරුද්ධවිය නොහැකි බවත්, නමුත් ඡන්දය ලබා දී අමාරුවේ වැටෙන්න බැරි බවත්, මෙය ආණ්ඩුකාරතුමියගෙන් පැහැදිලිව ගිහින් සාකච්ඡා කළ යුතු බවත්, ලේකම්තුමියම මෙම ගෙවීම වැරදි බව පවසන බවත්,එතකොට මෙහි වගකීම ගන්නේ කව්ද යන්නත්, හිටපු සභාපතිවරු කරපු වැරදි තීන්දු තීරණ නිසා මේ දේ වුනා කියන දෙය එදා ඉඳන්ම පවසන බවත්, දේශපාලනය මත හරි ක්‍රමවේදයක් අනුගමනය නොකර මෙලෙස ලබාදුන් පත්වීම් නිසා මෙලෙස සිදු වි ඇති බවත්, නමුත් දැන් මෙයට වගකියන්නේ කව්ද යන්නත්, මෙහිදි අසරණ වන බවත්, මෙහිදී හර්ෂණ මන්ත්‍රීතුමාගේ මතය සමඟ තමන් සිටින බවත්ය.

මෙහිදී මෙම ගෙවීම විගණනය මඟින් පෙන්වාදුන් නිර්ණායක පවතීනම් හෝ ආණ්ඩුකාරතුමා,කොමසාරිස්තුමා යන කව්රු හෝ මෙම ගෙවීම පිළිබඳව කියා ඇත්නම් එය කියන ලෙසත්, හිටපු දේශපාලන අධිකාරිය නිවරදි කර දැන් හරි පාලනයක් පවතින බව පැවසුවද දැන් ඔක්කොටම වඩා හපන් බවත්, එසේම චන්දන මැතිතුමා පැවසුවා දවස් 35ක් වැඩ කරපු සේවකයාට සම්මානයක් දෙන්න ඕනි කියලා මෙහෙ රොමියෙල් කියලා සේවකයෙක් ඉඳලා අවුරුදු 08ක් එකදිගට වැඩට ඇවිල්ලා ජනාධිපති සම්මානයත් ලබාගත් බවත් එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පවසන ලදී.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ මෙම කාරණාවේදී ඒ කියන පිරිස යම්කිසි රාජකාරියක් ආවරණය කරනු ලබන බවත්, ඒ අනුව හෙට දවසේ එය වෙනස් කළහොත් එම ආවරණය කරනු ලබන රාජකාරිවල පුරප්පාඩු මතුවන බවත්, එම කාරනාව ඉස්මතු කරමින් ආණ්ඩුකාරතුමිය වෙත ඉදිරිපත් කළ යුතු බවත්,එක පාරටම ආණ්ඩුකාරතුමිය කිව්වොත් මේ අය අයින් කරන්න කියලා එතුමිය මෙහි ප්‍රායෝගික තත්වය නොදන්නා බවත්ය.

එම කට්ටිය අයින් කරන්න කියලා තමන් නොකියන බවත්, තමන් පවසන දෙය හරියට තේරුම් ගන්නා ලෙසත්, සාමාන්‍යයෙන් දේශපාලන අධිකාරියකින් බලන්නේ තමන්ට බලයට ඒමට උදව් කළ අයට කුමක් හෝ උදව්වක් කරන බවත්, රාජ්‍ය සේවයේ එසේ ලබාදිය හැක්කේ සුළු සේවා පත්වීම් බවත්, අනෙකුත් තනතුරු සඳහා බඳවාගනු ලබන්නේ තරඟ විභාගවලින් බවත්, ඒ අනුව පත්වීමක් ලබා දුන් විට එම පත්වීම භාරගත් අය තනතුරු නාමයේම විස්තර කර ඇති බැවින් රාජකාරිය කුමක්ද යන්න දන්නා බවත්, මෙහි අඩුපාඩුවට ගෙව්වානම් එය ගැටළුවක් නොවන බවත්, නමුත් මෙහි ඇති ගැටලුව වන්නේ සෞඛ්‍ය කම්කරුවන් 22ක් සිටියදී මාර්ග නඩත්තු කම්කරුවන් 15 දෙනෙකුත් සිටියදී ඔවුන්ගෙන් එම සේවාව ලබා නොගෙන වෙනත් සේවාවල යෙදවීම කළමනාකාරිත්වයේ තිබෙන වැරැද්දක් බවත්, ඇත්තටම දෙවරක් පඩි ගෙවන්න බැහැ  මහජන මුදල් නාස්ති කරන්න බැහැ කියන දෙය තමන් පවසන බවත්ය.

මෙහිදී ගරු උප සභාපතිතුමන් විසින් තනතුරුවලින් පරිබාහිරව රාජකාරියේ යොදවා ඇති සේවකයන් යොදවා ඇති රාජකාරි පිළිබඳව සභාවට ඉදිරිපත් කරන ලද අතර එසේම සිටින සෞඛ්‍ය කම්කරුවන්ගේ සේවාව ලබා ගත හැකි ආකාරය සහ ඔවුන් එක් අයෙකුට වැඩි වැඩ ප්‍රමාණයක් යොදවා අමතර කම්කරුවන් ඉතිරි කරගන්නා ආකාරය පැහැදිලි කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා අදහස් දක්වමින් පැවසුයේ මේ සඳහා තමන් යෝජනාවක් ඉදිරිපත් කරන බවත්, වෙලාවක් වෙන් කරගෙන ආණ්ඩුකාරතුමිය සමඟ සාකච්ඡා කළ යුතු බවත්, උප සභාපතිතුමා හර්ෂණ මන්ත්‍රීතුමා වැනි මන්ත්‍රී

කණ්ඩායමක් සහභාගී කරවාගෙන ගොස් එතුමිය සමඟ සාකච්ඡා කර විසඳුමක් ලබාගන්නා ලෙසත්, මෙහි ඇති ගැටළුව පවසන ලෙසත්ය.

එමෙන්ම පසුගිය දිනෙක සභාවක මන්ත්‍රීවරයෙක් ඉල්ලා අස්වූ බවත්, ඒකට දැක්වූ හේතු අනුව බලනවිට ඊට වඩා දසගුණයක් මෙතන තිබෙන බවත්, තමා සභාපති වූ මුල්ම කාලයේ ට්‍රැක්ටරු රථ දෙකක්,ත්‍රීරෝද රථයක් ඉල්ලූ බවත්, නමුත් අහන අහන සැරේම කිව්වේ දෙකක් දෙන්නම් කියලා නමුත් දෙකක් තියා එකක්වත් නොමැති බවත්,මෙහි තිබෙන්නේ වාහන කබල් ටිකක් බවත්, නඩත්තු පිරිවැය වැඩි බවත්,පසුගිය දිනෙක රියදුරෙකුගෙන් වැඩද ඇහුවාම වැඩ කරන්න විදියක් නෑ වාහනේ කැඩිලා කියූ බවත්, ඒවගේම හැමදාම මේ තියෙන වාහන කැඩෙන බවත් එතුමා සඳහන් කළ අතර තවදුරටත් එතුමා පැවසුයේ ඉහත දෛනික වැටුප් සම්බන්ධ කාරණයට අදාළව බැලූ විට මෙය තවදුරටත් මේ ආකාරයෙන් පවත්වාගෙන යා නොහැකි බවත්, අදාළ බලධාරීන් සමඟ සාකච්ඡා කරන මෙම ගැටළුවට විසඳුමක් සොයන ලෙසත්, සභාවේද විවිධ විවාද ඇතිවෙනවා එසේම සභාපතිතුමාටද මෙම ගැටළුව විශාල පීඩනයක් බවත්ය.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසූයේ තමා බෙදීමක් ඉල්ලූ බැවින් එය ලබාදෙ ලෙසත් සභාපතිතුමා අතුරු ව්‍යවස්ථාව අනුව කටයුතු කරන ලෙසත්, අනෙක් අය අතින් පයින් කරන සංඥා වලින් තමන්ට වැඩක් නැති බවත්ය.

අනතුරුව ඊට පිළිතුරු ලබා දෙමින් ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා තමා එසේ සංඥා ලබා නොදුන් බව පැවසූ අතර ගරු සභාපතිතුමා මෙම අවස්ථාවේ බෙදීම ලබා දෙන ලෙස එතුමා පවසන ලදී.එසේම මෙවර මේ සඳහා පක්ෂව ඡන්දය ලබා දුන්නද තමන් ඇතුළු සභාව යෝජනා කරන පරිදි මානව සම්පත කළමණාකරණය වෙනුවෙන් අදාළ පියවර නොගන්නේ නම් ඊළඟ වර මෙය අනුමත නොකරන බවත්,මෙවැ ඡන්දය ලබා දෙන්නේ ආවරණ අනුමැතිය හේතුවෙන් බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා පැවසූයේ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා පැවසූ පරිදි ගරු ආණ්ඩුකරතුමිය හමුවී මේ පිළිබඳ සාකච්ඡා කිරීමට මත්තෙන් බළන්ගොඩ ආසනය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා සමඟ මෙම ගැටළු පිළිබඳ සාකච්ඡා කළ යුතු බවත්, ඉන්පසු මන්ත්‍රීතුමා සමඟ ආණ්ඩුකාරතුමිය හමුවී සාකච්ඡා කළයුතු බවත්,හැම පක්ෂයෙන්ම නියෝජනය වන පරිදි ඊට මන්ත්‍රීතුමන්ලාද සහභාගී කරවිය යුතු බවත්,නැතිනම් හැමදාම මෙම ගැටළු ඇතිවන බවත්,හැමදාම මෙම සභාව විහිළුවක් බවට පත්වන බවත්ය.

ඒ අනුව ගරු සභාපතිතුමා ඉහත 07:01:11 යෝජනාව සඳහා ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාගේ මතය විමසීම වෙනුවෙන් විවෘත ඡන්ද විමසීමක් පැවැත්වීමට කටයුතු කරන ලෙස ලේකම්තුමියට දැනුම් දෙන ලදී.

ඉහත 07:01:11 යෝජනාව සඳහා ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලාගේ මතය විමසීම වෙනුවෙන් පැවති විවෘත ඡන්ද විමසීම අනුව එකී යෝජනාවට පක්ෂව ගරු සභිකවරුන් 07 දෙනෙකුද, එනම්,

01.ගරු සභාපති එන්.ඩබ්.පී.ටී ජයසේන මැතිතුමා
02. ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා
05. ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා
06. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා
07. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා

එකී යෝජනාවට විපක්ෂව ගරු සභිකවරුන් 03 දෙනෙකුද , එනම්,

01. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
02. ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය
03. ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා

එකී යෝජනාවට ඡන්දය දීමෙන් වැළකී සිටි ගරු සභිකවරුන් 05 දෙනෙකුද , එනම්,

01. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා
02. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා
05. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා

ලෙස ගරු සභිකවරුන් තම ඡන්දය ප්‍රකාශ කළ අතර මෙහිදී ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී සමරසේකර මැතිතුමිය අදදින සභාවට නොපැමිණි සභිකයා වන අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා මෙම අවස්ථාව වන විට සභාවෙන් පිටව සිටි සභිකයා වේ. ඒ අනුව 07:01:11 යෝජනාව වැඩි ඡන්ද 04 කින් සභා සම්මත විය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පැවසුයේ මෙය කතා කළ යුතු ප්‍රශ්නයක් බවත්, දිගින් දිගටම මාස ගණනාවක් තිස්සේ මෙය අතීතයේ සිදුවූ ගැටළුවක් වුවත්,දැන් අපි ඇවිත් මෙය සිදු කළා වගේ තත්වයක් මෙහි දැන් නිර්මාණය වී ඇති බවත්,මෙයට එකඟ නැතිවුවද සභාව ගෙනයන මානසික මට්ටමෙන් මෙයට ඉඩ දෙන බවත්, නමුත් මේ අතීතයේ කරපු වැරැද්ද ඊළඟ සභාවාරයේදී නිවරදි කරගතයුතුම බවත්, එසේ නොමැතිනම් මීට අදාළව විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීමට තමන්ද සූදානම් බවත්, හේතුව මෙය ලොකු ප්‍රශ්නයක් බවත්, මෙය ඇත්තටම අතීතයේ හිටපු සභාපතිවරු, මන්ත්‍රීවරු

දේශපාලන පත්වීම් දීපු නිසා ඇති වී ඇති ගැටළුවක් බවත්, මෙය අපේ පිටින් යන්න ඕනෑනැති බවත්, ඒ අනුව ඊළඟ සභාවාරයේ මෙය නිවරදි කරමු යන්නත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදි.

අතීතයේ හිටපු අය කරපු වැරැද්දකුත් මෙහි තිබෙන නමුත් ඒ අය දීපු පත්වීම අදාළ තනතුරේ පිහිටවපු නැති එක වැරැද්ද බවත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසීය.මෙම අවස්ථාවේ සභාවේ සියළුදෙනා කතා කිරීමත් සමඟ ඝෝෂාවක් ඇතිවිය.ගරු සභාපතිතුමා පැවසුයේ හෙට සිටම එම තනතුරට අදාළ රාජකාරී නොකරන සියළු සේවකයන් අදාළ තනතුරේ රාජකාරී වෙනුවෙන් යොදවන බවයි.

**07:01:12** බළන්ගොඩ නගර සභාව සතු සම්පත් පියස මධ්‍යස්ථානය කඩ කාමර 02 ගල්වල පරිශ්‍රයට රැගෙන යාමටත් ඒ අනුව එකී මධ්‍යස්ථානය පිහිටි කඩ කාමර 02 රජයේ තක්සේරු පදනම් කරගෙන වාර්ෂික බදු පදනමින් විවෘත ලංසු කැඳවීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා පැවසුයේ සම්පත් පියස මධ්‍යස්ථානයේ කලින් කඩ කාමර 04ක් පමණක් ටෙන්ඩර් කල බවත්, සම්පත් පියස මධ්‍යස්ථානය පවත්වා ගෙන යාම වෙනුවෙන් කඩ කාමර 02ක් තබාගත් නමුත් එම පරිශ්‍රය ගල්වල වෙත රැගෙන යා හැකි බැවින් ඉතිරි කඩ කාමර 02ද ටෙන්ඩර් කිරීමට යෝජනා කරන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා, ඉහත ගල්වල පරිශ්‍රයේ Street food ව්‍යාපෘතියක් කිරීමේ ඉතා හොඳ යෝජනාවක් ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් ඉදිරිපත් කළ බවත්, ඒ අනුව ඒ පිළිබඳ විමසන ලදුව ගරු සභාපතිතුමා පැවසුයේ ඒ මාර්ගයේ අනිත් පස බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:01:13** බළන්ගොඩ නගර සභාව සතු සම්පත් පියස මධ්‍යස්ථානයේ කඩ කාමර බදු දීම සඳහා වන ගිවිසුම් කෙටුම්පත සඳහා සහා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු සභාපතිතුමන් විසින් යෝජනා කරන ලදුව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විමසුයේ මෙය වර්ෂයකට වඩා වැඩි කාලයකට බදු දිමේ හැකියාවක් නැද්ද යන්නයි.ගරු සභාපතිතුමා පැවසුයේ ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලැබී ඇත්තේ වර්ෂයක කාලයකට පමණක් බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02** ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා

**07:02:01** බුද්ධ ජයන්ති මාවතේ ඉහළ කොටසේ නිවාස වලට සපයා ඇති ජල සම්බන්ධතාවයන් වල පීඩන මට්ටම අඩු බැවින් බැංකියවත්ත ටැංකියෙන් ජල සම්බන්ධතා ලබා දී ඇති ඉහළ කොටසින් පහළට සම්බන්ධතාවයක් ලබා දීමට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට යෝජනාව යොමු කිරීමට යෝජනා කරමි.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කලේ බුද්ධ ජයන්ති මාවතේ ඉහළ කොටසේ නිවාස වලට සපයා ඇති ජල සම්බන්ධතාවයන් වල පීඩන මට්ටම අඩු බවත්, මෙහි පවුල් 16ක් පමණ සිටින බවත්, මෙම පිරිසට ජලය ලැබෙන ජල මාර්ගයෙන් ජලය අදින්නේ පොළොව මට්ටමට පමණක් බවත්, ඉහළ සිටින නිවැසියන් පොළොව මට්ටමින් ජල සම්බන්ධතාවය රැගෙන ජල මෝටර් මඟින් ඉහළට ජලය ලබා ගැනීමට සිදු වී ඇති බවත්, එම ජනතාවට ඊට වඩා පහසුවෙන් ඉහළින් ඇති නලජල මාර්ගයෙන් ජලය ලබාගැනීමට අවස්ථාව සැලසීම සඳහා ඉතා පොඩි ප්‍රමාණයක් පමණක් නල එලීමට ඇති බවත්, ඒ අනුව එම ගැටළුව විසඳෙන බවත්, මෙම ජනතාවට ජල බිලට අමතරව විදුලි බිලකුත් ගෙවීමට සිදු වී ඇති බවත්, ඒ අනුව මෙය සම්බන්ධීකරණ කමිටුවට යොමු කිරීමට ඉල්ලීම් කරන බවත්, එහිදී තමන්ටත් අවස්ථාවක් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02:02** ජාතික පොලෙහි කඩ කාමර ඉවත් කිරීම නිසා අසාධාරණයට ලක්වූ කඩ හිමියන් වෙත ස්ථානයක් ලබා දීමට හා ඔවුන්ට සාධාරණය ඉටු කිරීමට යෝජනා කරමි.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පැවසුයේ නගරයේ කලින් ජාතික පොළ නමින් පොළක් පැවති බවත්, තමන්ගේ දෙමව්පියන්ද එයින් තමන්ව ජීවත් කලේ මාර්කට් එකෙන් බවත්, ඒ අනුව එම වෙළෙන්දන්ගේ ජීවන මාර්ගය අහිමි වීමෙන් ඔවුන්ගේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම කඩා වැටී ඇති බවත්, එම ජාතික පොළෙන් ඉවත් කළ කඩ හිමියන්ට කඩ කාමර පොළ පිටුපසින් ලබා දිමට තිබූ බවත්, දැන් එයද නැති වී ඇති බවත්, 2024 වර්ෂයේ ඒ සම්බන්ධව ඔවුන්ට සාධාරණයක් කරදෙන දෙන ලෙස ලිපියක්ද යවා ඇති බවත්, නමුත් මේ වන තෙක් ඒ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගෙන නැති බවත්,ඒ අනුව එම අසරණ වුනු වෙළෙන්දන්ට යම්කිසි තැනක් ලබාදෙන ලෙස ඉල්ලීම් කරන බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා පැවසුයේ පසුගිය සභාවකදී කාර් පාර්ක් කඩ පෙළෙහි වහලය සම්බන්ධ ගැටළුවක් පිළිබඳව සාකච්ඡා කළ බවත්, නමුත් අදවන විට පොළ කඩ කාමරවල අගුවක් තිබෙන නමුත් දැන් එය දික්වී ඉදිරියට පැමිණ කඩ කාමර පුළුල් වී ඇති බවත්, ඒවා සභාව දැනුවත් වි සිදුකල යුතු බවත්ය.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා ඉහත මන්ත්‍රීතුමා විමසන කාරණය පිළිබඳව දැනුවත් විය යුතු බව පැවසූ අතර එම ස්ථානය පිළිබඳව විමසන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා පැවසූයේ එක් කඩ කාමරයක පමණක් නොව බොහෝ ඒවායේ එසේ පවත්නා බවයි.මෙතුමා පවසන කාරණය පිටුපස පවතින්නේ බරපතල චෝදනාවක් බවත්, අවසානයේ සභාව වැරදිකරුවන් විය යුතු නැති බවත්, එවැනි ආකාරයේ දෙයක් සිදු වී ඇත්ද යන්න සොයාබලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සුදුසු බව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසීය.

**07:02:03** ආදායම් වියදම් පිළිබඳව සාකච්ඡා කිරීමට යෝජනා කරමි.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා පැවසුයේ ඉහත යෝජනාව පිළිබඳව ආදායම් වියදම් පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවේදී මේ පිළිබඳ සාකච්ඡා කිරීමට හැකියාව ඇති බවයි.

**07:03 ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා**

**07:03:01** බළන්ගොඩ මහජන බැංකුව පිටුපස දෙවැට පාර සුද්ද කරදීම සහ කාණු පද්ධතිය සුද්ද කරදීම.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා සඳහන් කලේ මෙම යෝජනාව ලබාදුන්පසු මෙම මාර්ගය සුද්ද කර තිබූ බවත්,එය කර්මාන්ත කාරක සභාවේ සභාපතිතුමා ඒ පිළිබඳව දුරකථනයෙන් දැනුම්දුන් බවත්, ඒ සම්බන්ධව කර්මාන්ත කාරක සභාවට මෙන්ම සභාවටද ස්තුතිය පල කරන බවත්, එම මාර්ගයේ ඉතිරි කොටසත් නඩත්තු කරදෙන ලෙස යෝජනා කරන බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03:02** 2026 මන්ත්‍රී ප්‍රතිපාදන තුළින්, කිරිදිගල ශාන්ත ජෝසප් මරණාධාර සමිතියට පුටු 50ක් ලබාදීමට කටයුතු කිරීම.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා සඳහන් කලේ එම සමිතියේ ඉල්ලීම මෙම සභාවට එවා ඇති බවත්, ඒ අනුව තමන්ගේ 2026 මන්ත්‍රී ප්‍රතිපාදන වලින් එම ද්‍රව්‍ය ලබා දීමට කටයුතු කරන ලෙස යෝජනා කරන බවත්, ඒ සඳහා ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය අවශ්‍ය නම් ඒ සඳහා ඉදිරිපත් කරන ලෙසත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03:03** 2026 මන්ත්‍රී ප්‍රතිපාදන ඉතිරි මුදල,කරව්කැටිය ආරණ්‍ය සේනාසනයට සහ ගමට යන මාර්ගයේ කැඩී ගිය කොටස පිළිසකර කරදීමට කටයුතු කිරීම.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා සඳහන් කලේ 2026 මන්ත්‍රී ප්‍රතිපාදන ඉතිරි මුදලින් ඉහත යෝජනාව ක්‍රියාත්මක කරන ලෙසත්, එමෙන්ම මෙම අවස්ථාවේ හැකි ඉක්මනින් ඉහත යෝජනාවට අදාළව

ඇස්තමේන්තු සකස් කර දෙන ලෙස වැඩ අධිකාරි මහතාගෙන් ඉල්ලා සිටින බවත්, ඒ අනුව හැකි ඉක්මනින් මෙම යෝජනා ක්‍රියාත්මක කර දෙන ලෙසත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03:04** පහළ මස්සැන්න ගමට යන මාර්ගයේ සංවර්ධනය නොකළ ඉතිරි කොටස පිළිසකර කිරීම.

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙම සභාව පිහිටුවීමෙන් පසු සංවර්ධනය කළ පළමු මාර්ගය මෙය බවත්, එහි ඉතිරි කොටස සංවර්ධනය කිරීමට ඉහත යෝජනා කර ඇති බවත්, මේ සම්බන්ධව එම ගම්වාසීන් ලිපියකුත් ඉදිරිපත් කර ඇති බවත්,ඒ අනුව හැකි ඉක්මනින් එම පහළ මස්සැන්න ගමට යන මාර්ගයේ සංවර්ධනය නොකළ ඉතිරි කොටස සංවර්ධනය කර දෙන ලෙස මෙහිදී යෝජනා කරන බවත් ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා පවසන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04 ගරු නාගරික මන්ත්‍රිනි පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය**

**07:04:01** කලුවැල්ල කැලේ මාර්ගයේ ගමන් කිරිමට නොහැකි කොටසේ පඩිපෙලකින් බර්නාඩ් මහතාගේ නිවස අසලට මාර්ගය සම්බන්ධ කිරිම.

ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:04:02** CCTV සවිකිරිම තුලින් ලබාගෙන ඇති ප්‍රගතිය පිලිබද සාකච්ඡා කිරිම සහ ඒ පිලිබද යෝජනා ඉදිරිපත් කිරිම.

ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා පැවසුයේ එතුමිය අදදින නොපැමිණ ඇති බැවින් අදහස් කරන දෙය පිළිබඳව නොදන්නා බවයි.

**07:04:02** අනඳමෙත්ගම ප්‍රජාශාලාව අසල මාර්ගයේ කාණු පද්ධතිය සංවර්ධනය කිරීම.

ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:05 ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

**07:05:01** අවුරුදු කාලයතුල පිට වෙළෙන්දන් සඳහා පේමන්ට් ලබාදීම සම්බන්ධයෙන් බළන්ගොඩ ව්‍යාපාරික මහතුන් කළකිරීමට පත්ව ඇත.ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය සාකච්ඡා කරන්න.

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව එම්.ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය සඳහන් කලේ මෙය ප්‍රකාශ කිරීමට සිදුවීම පිළිබඳව කණගාටු වන බවත්, දැනට මෙම සභාවට පත්වී අවුරුද්දක් පමණ ගතවී ඇති බවත්, මුල්ම සභාවේ සිටම තමන් නගරයේ ව්‍යාපාරිකයන් ගෙන්වා සාකච්ඡා කරන ලෙස දැන්වූ බවත්, පසුගිය අලුත් අවුරුදු සමය නගරයේ ව්‍යාපාරිකයන්ට විශාල ගැටළුවක් වී තිබුන බවත්, එහිදී පේමන්ට් වෙළඳාම සිදු කලේ නගරයට පිටින් පැමිණි වෙළෙන්දන් බවත්,බළන්ගොඩ නගරයේ වෙළෙන්දන්ට එය විශාල ගැටළුවක් වූ බවත්, නමුත් සභාවට හැමදාම බදු ගෙවන ව්‍යාපාරිකයන්ට එම අවුරුද්ද ඉතාම අසාර්ථක අවුරුද්දක් වූ බවත්, ඒ පිළිබඳව විමසීමේදී කියන්න දෙයක් නොතිබූ බවත්ය.

එතුමිය වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසුයේ එම අවුරුදු සමයට පෙර ව්‍යාපාරිකයන් ගෙන්වා සාකච්ඡා කර තිබුනේ නම් එම ගැටළුව මතු නොවන බවත්, මන්ත්‍රීවරුන් ලෙස එවැනි දෙයක්වත් කෙරෙන්නේ නැත්තම් වැඩක් නැති බවත්, ඔවුන් දෝෂාරෝපණය කරන බවත්, ඉදිරියට මෙවැනි උත්සව සමයන්වලදී ඔවුන් ගෙන්වා සාකච්ඡා කර අවශ්‍ය පියවර ගැනීම කල යුතු බවත්, නගරයට ආදායමක් එන විදියට ක්‍රියාමාර්ග ගත යුතු බවත්, ව්‍යාපාරිකයන්ගේ සහයෝගය නොමැතිව නගර සභාවක් පවත්වා ගෙන යා නොහැකි බවත්, ඒ අනුව ඉදිරියේදී සැලැස්මක් සහිතව අධීක්ෂණ නිලධාරින් යොදවා මෙවැනි උත්සව සමයන්හි කටයුතු කළ යුතු බවත්, නගරයේ සියළු ව්‍යාපාරියන් සභාවේ සියළුම

මන්ත්‍රීවරුන් ගෙන්වා සාකච්ඡා කළ යුතු බවත්, එසේ නොමැති වුවහොත් සභාවේ ඉදිරි කටයුතු අකර්මන්‍ය වන බවත්ය.

**07:06** ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා

**07:06:01** පසුගිය සිංහල හා හින්දු අලුත් අවුරුදු සමය වෙනුවෙන් නගර සභාව විසින් පදික වෙළඳුන් හා රථවාහන හැසිරවීම සම්බන්ධව සහ වරිපනම් හා බදු ගෙවන ව්‍යාපාරිකයන් වෙනුවෙන් කටයුතු කළ ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීමට යෝජනා කරමි.

ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත සඳහන් යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා සඳහන් කලේ තමන් කතා කරන්න සිටි ගොඩක් කරුණු ඉහත ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමියගේ කතාවෙන් කියවූ බවත්, මෙම නගරයට පිටින් පැමිණෙන පදික වෙළඳාමෙන් බදු ගෙවන ව්‍යාපාරිකයන්ට මෙවර අවුරුදු සමයේ ලොකු අසාධාරණයක් සිදු වූ බවත්, එයින් නගර සභාවට අදායමක් ලැබෙන්නේද නැති බවත්, එයට ප්‍රධානම හේතුව වූයේ නගර සභාවේ සැලැස්මක් නොමැතිවීම බවත්, මීට කලින් අවුරුදු කාලවලදීනම් පොලිසිය සමඟ එකතුවී නගරයේ රථවාහන සැලැස්මක් හදන බවත්, මෙම වසරේ එවැනි දෙයක් සිද් නොවූ බවත්, එසේම බස්රථ අලුත්පාරෙන් ගමන් කරවීම හේතුවෙන් පරණ පාර වෙළඳුන්ට අසාධාරණයක් සිදුවූ බවත්, බස්රථ එම මාර්ගයේ ධාවනය වූවානම් මීට වඩා වෙළඳාමක් එම වෙළඳුන්ට ලැබෙන බවත්ය.

ගරු උපසභාපති නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුවේ ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමාගේ කතාව නිවැරදි බවත්, සභාව ලෙස අලුත් අවුරුදු සමයේ කිසිදු මැදිහත්වීමක් සිදු නොවූ බවත්, එසේම පිට්ටනිය පාරේ තව කණ්ඩායමක් මහා පරිමාණයෙන් වළං විකිණීම කරනවා දුටු බවත්, ඒවායින් සභාවට අය කිරීමක් සිදු නොකළ බවත්,ඒවා සම්පූර්ණයෙන් පාලනය කළේ පොළ ටෙන්ඩර්කරු බවත් එම භූමිය විකිණීම කළ බවට තමන් හොඳාකාරවම දන්නා බවත්, එසේ නොමැති නම් මෙතරම් තදබදයක් සිදුවෙද්දී පැමිණිලි කොතරම් ප්‍රමාණයක් සභාවට ලැබිය යුතු ද යන්නත්, පිට්ටනිය සිට පොළ දක්වා සම්පූර්ණ භූමිය වළං වෙළෙන්දන්ට ලබාදී තිබූ බවත්, සභාවට කිසිදු පැමිණිල්ලක් පොල ටෙන්ඩර් කරුගෙන් නොමැති බවත්, එබැවින් මෙවැනි දේ ඉදිරියට සිදු නොවීමට එම උත්සව සමයන්හිදී සැලැස්මක් සකස් කළ යුතු බවත් ය.

මේ අතර ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූමි මැතිතුමා පැවසුවේ ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමාගේ කතාව නිවැරදි බවත්, තමන් 2006 වර්ෂයේ සිට නාගරික

මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කරමින් සිටින බවත්, සෑම අවුරුද්දකම 10-14 වන දා දක්වා රථ වාහන සැලැස්ම බලංගොඩ නගර සභාව සහ පොලිසිය එකතු වී සාදන බවත්, එම කාලසීමාව තුළ බළන්ගොඩ ව්‍යාපාරික ජනතාව ආරක්ෂා කිරීමට පියවර ගන්නා බවත්, බළන්ගොඩ ව්‍යාපාරිකයන් යනු නගර සභාවේ හදවත බවත්, ඔවුන් සභාවට ආදායම් ලබා දෙන බවත්, නමුත් මෙම වසරේ පිටස්තර වෙළෙන්දන් සම්බන්ධව ක්‍රියා කළ ආකාරය පිළිබඳව නගර සභාවේ කිසිදු සැලැස්මක් නොතිබූ බවත්, මීන් පෙර වම්ක සභාපතිතුමාට පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පවා අවුරුදු සමයේ මෙම වළං වෙළෙන්දන් සම්බන්ධව කතා කළමුත් එතුමා ඊට අවස්ථාව ලබා නොදුන් බවත්, එවැනි ක්‍රියාමාර්ග ගනු ලැබුවේ බළන්ගොඩ ව්‍යාපාරිකයා ආරක්ෂා කිරීම සඳහා බවත්, නමුත් මෙහිදී කිසිදු ක්‍රියාමාර්ගයක් අධීක්ෂණයක් සිදු නොවූ බවත්, නගර සභාව ලෙස සෑම අවස්ථාවකම නගරයේ ව්‍යාපාරිකයා ආරක්ෂා කිරීමට බැඳී සිටිය යුතු බවත්, ප්‍රධාන පාරේ කිසිදු වාහනයක් එම 10-14 දින තුළදී නැවැත්වීමට ඉඩ ලබා නොදුන් බවත් මෙවැනි දෙයක් ඉදිරියේදී සිදු නොවීමට සහ ව්‍යාපාරිකයන් ආරක්ෂා කිරීමත් අපගේ යුතුකම බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදි.

**07:06:02** රජය විසින් මැයි 27 සිට ජූනි 2 දක්වා වෙසක් සතියක් නම්කර තිබේ.නගර සභාව විසින් අනෙකුත් රාජ්‍ය ආයතන සම්බන්ධ කර ගනිමින් නගරය අලංකරණය කිරීමට යම්කිසි වැඩපිළිවෙලක් සකස් කිරීමට යෝජනා කරමි.

ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු සභාපති තුමා මෙහි දී පැවසුවේ මේ සම්බන්ධව අද දින ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී සාකච්ඡා කරන බවයි. ගරු නාගරික මන්ත්‍රී එස්.යූ,සී ජයනක මැතිතුමා පැවසුයේ ව්‍යාපාරිකයන් දැනුවත් කර වෙසක් කූඩුවක්වත් එල්ලීමට කටයුතු කරන ලෙසට ඉල්ලීම් කළයුතු බවත් පොලිසියේ සමග පසුගිය වසරවල් වලදී වෙසක් උළෙලක් පැවැත්වූ බවත් ඒ ආකාරයට මෙවරද සිදුකිරීමට හැකියාවක් පවතින්නේ නම් ඒ ගැන සලකා බැලිය යුතු බවත්ය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06:03** සුදර්ශනගම කසළ එකතු නොකිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට යෝජනා කරමි.

ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එච්.ජ්.එච්.එන් හෙට්ටආරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු උපසභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ කසළ ටෙන්ඩර් ගිවිසුම සකස් කර ඇත්තේ තනි පුද්ගලයෙකුට අවශ්‍ය ආකාරයට බවත්, ගිවිසුමේ මෙම මාර්ගය ඇතුළත් කර නොමැති බවත්,ටෙන්ඩර්කරුට ඉදිරිපත් කළ යෝජනාවල පවතින බවත්, ටිපර් එක යවන කතාව ගිවිසුමට ඇතුළත්වි නොමැති බවත්ය. මේ අතර ගරු නාගරික මන්ත්‍රී එච්.ජ්.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කරේ ශෛලතලාරාම මාර්ගයේ බ්‍රහස්පතින්දාට කුණු එකතු කිරීම සිදු නොවන බවත් ටිපර් රථය ඉල්ලා සෑම විටම කරදර කිරීමට සිදුවන බවත්ය. ගරු සභාපතිතුමා ඊට පිළිතුරු ලබා දෙමින් පැවසූයේ කර්මාන්ත අංශයේ වැඩ සඳහා ටිපර් රථය යෙදවීමේදී ඒ ලබාදීම පිළිබඳ ගැටලුව මතුවන බවයි.

මෙම අවස්ථාවේදී ගරු සභාපතිතුමා සම්බන්ධීකරණ කමිටුව වෙත සහභාගී විය යුතු බැවින් මූලාසනය ප.ව.1.56ට පමණ ගරු උපසභාපතිතුමාට භාර දෙන ලදී.මෙහිදී ගරු උපසභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසූයේ මූලාසනයේ කටයුතු කරන පළමු අවස්ථාව බැවින් එම කටයුතු වෙනුවෙන් සහයෝගය ලබා දෙන ලෙස සියලු දෙනාගෙන් ඉල්ලීම් කරන බවයි.

**07:07 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා**

**07:07:01** දෙවැට පාරේ වන්න මහතාගේ නිවසේ සිට මල්ලිකා මහත්මියගේ නිවස දක්වා දිවෙන මාර්ගයේ කාණු පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම හා එම මාර්ගයේ ඉන්දික මහතාගේ නිවෙස පිටුපස පැති බැම්ම ඉදිකිරීම.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව පිළිබඳව අදහස් දැක්වීමට පෙර උපසභාපතිතුමා මූලාසනයේ කටයුතු කිරීම සම්බන්ධව උණුසුම් සුබ පැතුම් ලබාදෙන බවත්, ඒ පිළිබඳව සතුටු වන බවත් ඉහත දෙවට පාරේ කාණුව එම ප්‍රදේශයේ වැසි ජලය ගලා බසින් ප්‍රධාන කාණුව බවත් එම කාණුව අවුරුදු ගණනකින් කිසිම ප්‍රතිසංස්කරණයක් සිදුකර නොමැති බවත්, නගරයේ පවතින උස් බිම් වල ජලය සියල්ල එතනින් ගලා බසින බවත්, එම ස්ථානයේ නිරීක්ෂණය කර එය ප්‍රයෝගිකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා පවසන ලදී.

ගරු උපසභාපතිතුමා පැවසුයේ තමන්ට නගරයේ කාණු සම්බන්ධව හොඳ අවබෝධයක් පවතින බවත් බාන්ස් රත්වත්ත මාවතේ එකතුවන සියලුම ජලය ගලා බසිනුයේ මෙම කාණුවෙන් බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් පැවසුයේ තමන් සභාපති වී සිටි කාලවල් වලදීද කුමන හෝ අය යෝජනා ඉදිරිපත් කර අනුමැතිය ලබා ගන්නා බවත් වියදම පිළිබඳව දැනුවත් නොමැති බවත්, එබැවින් වැඩ අධිකාරී මහතා හෝ කාර්මික නිලධාරී මහතා මගින් ඇස්තමේන්තුවක් සකස්කර සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීම සුදුසු වන බවත්ය. එසේම ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්තබී බණ්ඩාර මැතිතුමා නගර වසමේ මන්ත්‍රීතුමා බැවින් මෙම සංවර්ධන කටයුතු සිදුකළ යුතු බවත්,නමුත් ඇස්තමේන්තු සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන සිදු කිරීම සුදුසු වන බවත් එතුමා පැවසීය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:08 ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

**07:08:01** හිටපු නාගරික මන්ත්‍රී වරයෙකු සහ බළන්ගොඩ ප්‍රදේශයේ ප්‍රකට සමාජ සේවකයෙකු වූ දිවංගත "ධර්මසේන සමරසිංහ" මැතිතුමාට උපහාරයක් ලෙස නාගරික ළමා උද්‍යානය "ධර්මසේන සමරසිංහ" ළමා උද්‍යානය ලෙස නම් කිරීමට යෝජනා කරමි.

ගරු උප සභාපති නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කළ ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා අදහස් දක්වමින් ධර්මසේන සමරසිංහ මැතිතුමා බළන්ගොඩ නගර සභාවේ සිටි දක්ෂ මන්ත්‍රීතුමෙකු බවත්, බළන්ගොඩ නගරයට ආදරය කළ මන්ත්‍රීවරයෙකු බවත්, එතුමා ළමා උද්‍යානය එම ස්ථානයට ගෙන ඒමට යෝජනා කළ පළමු පුද්ගලයා බවත් එතුමා සෑම විටම බලන්ගොඩ නගරයේ ව්‍යාපාරිකයන් ආරක්ෂා කිරීම සඳහා කතා කළ බවත්, බළන්ගොඩ නගරය සංවර්ධනය කෙසේ විය යුතුද යන්න පිළිබඳව එතුමාට ලොකු සිහිනයක් තිබූ බවත්, තුඹගොඩ දෙහිගස්තලාව බළන්ගොඩ කොට්ඨාශ මෙන්ම නගරයට එතුමා විශාල වැඩ කොටසක් සිදුකළ බවත්, එතුමාගේ පුත්‍රයා සභික ධූරය දරන කාලය තුළ එතුමාගේ නාමය මෙලෙස යෙදවීම පිළිබඳව සතුටු වන බවත්, ඒ සඳහා කිසිවෙකු විරුද්ධ නොවනු ඇති බවත් බළන්ගොඩ නගර සභාව තුළ මෙලෙස කුඩා දරුවන්ට සෙල්ලම් කිරීමට හැකි ස්ථානයක් එතෙක් නොතිබූ බවත්, අද වන විට ජනතාව එය විශාල ලෙස පරිහරණය කරන බවත් ,එතුමාගේ පෞද්ගලික ධනය පවා මේ සඳහා වියදම් කර ඇති බවත්, එසේම බළන්ගොඩ

ව්‍යාපාරිකයන්ගේ අනුග්‍රහය ද ලබා ගත් බවත්,එබැවින් තමා සිතන ආකාරයට මෙය ඉතා සුදුසුම යෝජනාවක් බවත්, තමන්ගේ සම්පූර්ණ සහයෝගය ලබා දෙන බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් තමන් ඇතුළු මෙහි පිරිසක් මෙහි සිටි මන්ත්‍රීවරු බවත්, සමරසිංහ මන්ත්‍රීතුමා ජනතාව වෙනුවෙන් විශාල කැපවීමක් උනන්දුවක් තිබූ මන්ත්‍රීවරයකු බවත්, තමා ළඟින්ම සිටි මන්ත්‍රීවරයකු බවත් නමුත් එතුමාගේ පෞද්ගලික ධනය වියදම් කළ බවට පැවසුවද තමන් ඒ පිළිබඳව නොදන්නා බවත්, සංගමයක ලක්ෂ 14, 18 ක් තිබී ආනන්ද සභාපතිතුමා සමග රණ්ඩු වූ බවත්, එතුමා ළමා උද්‍යානයේ සෑදීමට යෝජනා කළ බව පැවසුවද එය එසේ නොවන බවත්, තමන් කුඩා කාලයේද ළමා උද්‍යානය තිබූ බවත් එතුමා එය නවීකරණයට දායක වූ බවත්, එතුමා මග නැගුම ගමනැගුම ආදීඅ රමුදල් මගින් මුදල් ප්‍රතිපාදන ලබාගෙන ඒවා සිදු කළ බවත්, එතුමාගේ බිරිඳ සමගින් එම උද්‍යානය ක බලා ගැනීමට පවා දායක වූ බවත්, එතුමාගේ නම දැමීම සම්බන්ධව තමන්ගේ විරුද්ධත්වයක් නොමැති බවත්ය.

එසේම එතුමා තවදුරටත් අදහස් දක්වමින් පැවසුවේ පසුගියදා පූජ්‍යදාස තේනුවර මාවත විවෘත කිරීමේදී සභාවේ කිසිදු අයෙකු තමන්ට ආරාධනා නොකළ බවත්, එහිදී දේශබන්දු මහතා එම උත්සවයට සහභාගී නොවන්නේද යන්න විමසූ විට ආරාධනා නොකළ බව පැවසූ බවත්, එතුමාද එහිදී ළමා උද්‍යානයට සමරසිංහ මැතිතුමාගේ නාමය දැමීම සුදුසු බව පැවසූ බවත් මෙම නම කොහෙන් ආවද කියා නොදන්නා බවත්, තමන් විරුද්ධ නොවන බවත්, මාර්ග උද්‍යාන නම් කිරීමේදී එයට සභා අනුමැතිය ලබාගෙන කොමසාරිස් තුමා වෙත ඉදිරිපත් කර ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබාගෙන මන්ත්‍රීතුමා හරහා පාර්ලිමේන්තුවට දැමිය යුතු බවත්, මෙහි ඇතැම් අය හරිහැටි කරුණු නොදැන කතා කරන බැවින් තමන් මෙසේ පවසන බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

සමරසිංහ මැතිතුමාගේ නාමය ළමා උද්‍යානයට යෝජනා කිරීමට ප්‍රමාද වූයේ ඇයිද යන්න පිළිබඳව ගැටලුවක් පවත්නා බවත් මෙය ඉතාමත් හොඳ කටයුත්තක් එබැවින් තමාගේ සම්පූර්ණ සහයෝගය ලබාදෙන බවත් ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ. එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා පවසන ලදි.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා පැවසුයේ තමන් සිටින කාලයේ සමරසිංහ මැතිතුමා පෞද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන රුපියල් ලක්ෂ දහයක් ළමා උද්‍යානයට යෙදවූ බවත්, එතුමාගේ නම දැමීම පිළිබඳව විරුද්ධ නොවන බවත් එය අනිවාර්යයෙන් සිදු කළ යුතු දෙයක් බවත් ය. එමෙන්ම මෙම සභාවේ අබුසාලි මැතිතුමාගේ නාමය පූජ්‍යදාස තේනුවර හිටපු අධ්‍යක්ෂකතුමාගේ නාමය ශ්‍රී සංඝබෝධි ස්වාමීන් වහන්සේ නමගේ නාමය ආදි මාර්ග නම් කිරීම් කිසිදු විරුද්ධත්වයක් නොමැතිව සභා

සම්මත වූ බවත් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා ද එය අත්සන් කර මෙහි විරෝධතා කැඳවා ගෙන තිබූ බවත්, අවසානයේ පාස්කු ගැටලුව හේතුවෙන් මෙම කටයුතු ප්‍රමාද වූ බවත්,බාන්ස් රත්වත්ත මාවත, මොහාන්සාලිය එල්ලාවල මාවත ආදී මාර්ග පවතින බවත් ඒවා එසේ දැමිය යුතු බවත්, විශාල සේවයක් සිදු කළ අබුසාලි මැතිතුමාගේ නමින් මාර්ග නම් කිරීමක් කළ යුතු බවත් මෙම අවස්ථාවේ සමරසිංහ මැතිතුමාගේ නාමය යෙදවීමට තම එකඟතාවය ලබාදෙන බවත්ය.

පූජ්‍යදාස තේනුවර මාවත නම් කිරීමට අදාළ ව තමන් සමග උප සභාපතිතුමා මේ කටයුතු සඳහා මැදිහත් වී ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබාගෙන එම කටයුතු සිදුකළ බවත් එයට ආරාධනා කිරීම් සම්බන්ධව නොදන්නා බවත් සභාපතිතුමා එය වට්ස්ඇප් ගෲප් එකට දැමූ බව පැවසූ බවත්, එහිදී තේනුවර මහතා සමීපව ඇසුරු කළ පිරිසක් ඒ සඳහා සහභාගී වූ බවත් ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා පවසීය.

ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී ජයනක මැතිතුමා සඳහන් කලේ කලින් එම ස්ථානයේ ළමා උද්‍යානයක් තිබූ බවට වසන්ත මන්ත්‍රීතුමා පැවසූ බවත්, නමුත් තමන් කුඩා කාලයේ ළමා උද්‍යානයක් තිබූ බව අසා තිබෙන බවත් මෙය පටන් ගත්තේ තමන්ගේ පියා බවත්, මෙය තම පියාගේ එක් සිහිනයක් බවත්,එයට මුල් වුනේ තම පියා බවත්, තමන් දැනුවත්වම පියාගේ පෞද්ගලික මුදල් මේ සඳහා යෙදවූ බවත් ඉහත යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධව ගරු උපසභාපතිතුමාට ස්තුතිවන්ත වන බවත්ය.

අනතුරුව ගරු උපසභාපතිතුමා පැවසූයේ වීථි නම් කිරීම් පනත යටතේ මේ සිදුකළ යුතු බවත්, සභා අනුමැතියෙන් පසු විරෝධතා කැඳවීමට දැන්වීම් ප්‍රචාරය කළ යුතු බවත්, ඉන්පසු විරෝධතා නොවන බවට පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාට දැන්වූ පසු එතුමාගේ නිර්දේශය සමඟ ආණ්ඩුකාර තුමියට යැවීමෙන් මෙම කටයුතු සිදුවන බවත්, ඒ අනුව අබුසාලි මැතිතුමාගේ නමෙන් තානායම් පිවිසුම් පාර නම් කිරීමේ කටයුතු ආරම්භ වී ඇති බවත්, හෙටින් පසු මෙම ළමා උද්‍යානය නම් කිරීමේ කටයුතු සමග එයත් ඉදිරි කටයුතු සඳහා යොමු කරන බවත්ය.

තමන් 2019 වර්ෂයේ මහ සභාවක දී කියන්නෑම් පාර සඳහා ශ්‍රී සංඝබෝධි නාහිමි මාවත නමින් නම් කිරීමට යෝජනා කළ අතර එම කටයුතු අතරමග නතර වී ඇති බවත්, ඒ අනුව එම මාර්ගය නම් කිරීමේ කටයුතුද මේ සමග සිදුවිය යුතු බවත්, මෙම ගමට යන මාර්ගය එම ස්වාමීන් වහන්සේ විසින් සාදාදී ඇති බවත් ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසූයේ තමන් සිටින කාලයේ ළමා උද්‍යානයේ වැසිකිලි පද්ධතිය සභාවේ මුදලින් සකස් කළ බවත්, ලයිට් දමා ගේට්ටු දමා සකස් කර ලබාදුන් බවත්, අඩුගානේ ඒවාවත් මතක් කරන ලෙසත්ය. මේ අතරේ ගරු

නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා පැවසුවේ ළමා උද්‍යානය නම් කිරීම පිළිබඳ ගැටලුවක් නොමැති බවත්, ළමා උද්‍යානයට අළුතින් එකතු කළ කොටසට තණකොළ ටික අල්ලලා හෝ ඊට ප්‍රවේශය ලබාදෙන ලෙසයි. එමෙන්ම නගරයේ මාර්ගවල නාමපුවරු සැහෙන ප්‍රමාණයක් විනාශ වී ඇති බවත්, ඒ සඳහාද අවධානය යොමු කර අනුග්‍රාහකත්වයක් හෝ ලබාගෙන ප්‍රතිසංස්කරණය කළ යුතු බව එතුමා වැඩිදුරටත් සඳහන් කළේය.

ඊට පිළිතුරු ලබාදෙමින් ගරු උපසභාපතිතුමා පැවසූයේ ළමා උද්‍යානයට ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ ප්‍රතිපාදනවලින් කොටසක් වෙන්කර ඇති බැවින් එයද සංවර්ධනය කර ධර්මදාස සමරසිංහ මැතිතුමාගේ නමින් නම් කිරීමට කටයුතු කරන බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:08:02** තුඹගොඩ ශ්‍රී සංඝික මහා සුධර්මාරාම විහාරස්ථානයේ 102 වෙනි වරට පවත්වනු ලබන මිහිඳු මහා පෙරහැර සඳහා මූල්‍ය පරිත්‍යාගයක් ලෙස රුපියල් ලක්ෂයක් (100,000/= ) ක් ලබාදීම.(ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යටත්ව පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන මඟින්)

ඉහත සඳහන් ගරු උප සභාපතිතුමන් විසින් ඉදිරිපත් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම් බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:09 ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා**

**07:09:01** මහජන පුස්තකාලය සඳහා Manual Signature පොත වෙනුවට Digital Signature Card පත හඳුන්වා දීම සඳහා යෝජනා කිරීම.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත ඉදිරිපත් කර ඇති යෝජනාව පිළිබඳව අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී එන්. ඒ. එස් චන්දන මැතිතුමා සඳහන් කළේ පුස්තකාලයේ ඇති වූ යම් යම් ගැටලු හේතුවෙන් Manual Signature පොත වෙනුවට Digital Signature Card හඳුන්වාදීමට යෝජනා කර ඇති බවත් සමහර වෙලාවල් වලදී අත්සන් යෙදීමකින් තොරව පාඨකයින් ඇතුළත් වන බැවින් එයටද මෙය විසඳුමක් වනු ඇති බවත්ය. මෙහිදී ගරු උසභාපතිතුමා පැවසූයේ පුස්තකාල කාරක සභාවේදී සාකච්ඡා කර ප්‍රායෝගික තත්ත්වය පිළිබඳව සලකා බලා ඉහත යෝජනාව

ක්‍රියාත්මක කළ යුතු බවයි. මෙම වර්ෂයේ පුස්තකාල කාරක සභාව තවම නොපැවැත්වූ බවත් මෙම කාරක සභාවලින් ක්‍රියාත්මක වන්නේ මුදල් කාරක සභාව පමණක් බවත් ගරු නාගරික මන්ත්‍රී එන්. ඒ. එස් චන්දන මැතිතුමා පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:09:02** බළන්ගොඩ නගර සභාව සතු අධික පිරිවැයක් දැරීමට සිදුවන සහ භාවිතයට ගත නොහැකි රථ වාහන සහ දැනට තානායම් පරිශ්‍රයේ පවතින විදුලි උත්පාදන යන්ත්‍රය යාන්ත්‍රික ඉංජිනේරු ලවා පරීක්ෂා කර වෙන්දේසි කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය ලබා ගැනීමට යෝජනා කරමි.

ඉහත සඳහන් යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ඉහත යෝජනාව පිළිබඳව අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා අදහස් දක්වමින් පැවසුයේ සභාව සතුව වෙන්දේසි කළ යුතු තත්වයේ තිබෙන වාහන වෙන්දේසි කිරීමට යෝජනාවෙන් අදහස් කළ බවත්, එමෙන්ම තානායමේ විදුලි උත්පාදන යන්ත්‍රය භාවිතා කිරීමක් සිදු නොකරන බැවින් වෙන්දේසි කිරීමට යෝජනා කර ඇති බවත්ය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

ගරු උපසභාපතිතුමා පැවසුයේ මේ සම්බන්ධව මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛයක් පවත්නා බවත්, ඒ අනුව සමීක්ෂණ මණ්ඩලයක් පත්කළ යුතු බවත්,ඒ අනුව අපහරණ කමිටුවක්ද පත්කිරීමට කටයුතු කළ යුතු බවයි. සභාවේ ඉතා පැරණි වාහන තබාගන සිටීම වැඩක් නැති බවත් මෙසේ සිදුකර හෝ ඒ සඳහා පිළියම් සොයන ලෙස ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා සඳහන් කරන ලදී.

**07:09:03** ආරම්භක සභාවේ දී මා විසින් ඉදිරිපත් කරනු ලැබූ SREET FOOD INSTALL ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු සකස් කරගැනීම සඳහා අනුමත කිරීම සඳහා යෝජනා කරමි.

ඉහත සඳහන් ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම් බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා ගරු උපසභාපතිතුමා පැවසුයේ වැඩ අධිකාරීතුමා සමඟ සම්බන්ධීකරණය වෙමින් ප්‍රතිපාදන සපයා ගන්නා ආකාරය සාකච්ඡා කර ඇස්තමේන්තු සකස් කරගන්නා ලෙසයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:09:04** 2025 වර්ෂයට අදාළ මන්ත්‍රී ප්‍රතිපාදන රු.75,000.00 සඳහා බුලත්ගම වැවවත්ත බැංකියවත්ත ක්‍රීඩා තරුණ සමාජ සඳහා වොලිබෝල් නෙට් සහ වොලිබෝල් ලබා දීමට යෝජනා කරමි.

ඉහත සඳහන් ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම් බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු උපසභාපතිතුමා පැවසුයේ 2025 වර්ෂයට අදාළ මන්ත්‍රී ප්‍රතිපාදන රු. 75000 සඳහා ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා මින් පෙර ඉදිරිපත් කළ කිච්ලෙවෙල නිවාසයක් සඳහා නිවාස ආධාර දීමේ යෝජනාව ක්‍රියාත්මක නොකර මෙම යෝජනාව ක්‍රියාත්මක කරන්නේද යන්නයි. ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා පැවසුයේ එය ක්‍රියාත්මක තත්ත්වයේ නොපවතින බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බවයි.

ගරු උප සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් පැවසුයේ එම යෝජනාවට අදාලව ආපදාවට ලක්වූ නිවස සඳහා නිවාස ආධාර යෝජනාව ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යැවූ පසු දිට්වා සුළි කුණාටුවට අදාළ වන්දි වලින් වෙනත් ආධාර ලැබී ඇත්ද යන්න පිළිබඳව ප්‍රාදේශීය ලේකම් තහවුරුව ලබා දෙන ලෙස ලිපි යොමු කර ඇති බවත්, නමුත් එයට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් තවමත් පිළිතුරක් ලැබී නොමැති බවත්ය. එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පැවසුයේ මෙය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආපදා නිලධාරී සමඟ ද සාකච්ඡා කළ බවත්,එහිදී එම නිවැසියන් පූර්ණ හානි ලෙස පැවසුවද සිදුවී ඇති අර්ධ හානි වෙනුවෙන් වන්දි ලබාදෙන බව පැවසූ බවයි.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:09:05** 18/D ,සුදර්ශනගම, තුඹගොඩ ලිපිනයෙහි පදිංචි ජී.ජී සිරිලාල් මහතාගේ නිවස ඉදිරිපිට කාණුව සකස් කිරීම සඳහා යෝජනා කරමි.

ඉහත සඳහන් ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම් බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:10 ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා**

**07:10:01** බළන්ගොඩ නගර සභාව සතු ගලි ටැංකිය වර්තමානය වන විට නැවතත් අබලන් වී පවතින නිසා අලුත් ගලි ටැංකියක් මිලදී ගැනීම සඳහා යෝජනා කරමි.(අප්‍රේල් මාසයෙහි පමණක් ගලි ආදායම රු ලක්ෂ 10 ඉක්මවා ඇත.)

ඉහත සඳහන් ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ඉහත සඳහන් යෝජනාව පිළිබඳව අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා පැවසූයේ මාස ගණනකට කලින් ගලිටැංකිය තෙබුවන ගරාජ් ආයතනයේ විශාල කාලයක් නතර කර තිබූ බවත්, මෙය ආපසු සිදුවනු ඇති බවත් එබැවින් එය සිදුවීමට පෙර ටෙන්ඩර් කැඳවා ගලිටැංකියක් මිලදී ගැනීමේ කටයුතු කිරීම සුදුසු වන බවයි. එසේම හිටපු ගරු සභාපති වසන්ත ගුණරත්න මැතිතුමාගේ කාලයේ එතුමා විශාල ආදායම් පෙන්නු බව පැවසූ බවත්, එහිදී වැඩිම ආදායමක් පෙන්වා ඇත්තේ ගලි ආදායමෙන් බවත්, නමුත් දැනට දිනකට ගනු ලබන්නේ ලෝඩ් 4-5පමණක් බවත් ගලිවාර ගණන වැඩි කර ආදායම වැඩි කිරීමට අවධානය යොමු කළ යුතු බවත්, සුභසාධනයක් ලෙස කසල එකතු කිරීම සිදුකළද ගලිය යනු ආදායම් මාර්ගයක් බැවින් වාර ගණන වැඩිකර ආදායම් උපයන්නේ නම් ආදායමේ හිඟය අවම වනු ඇති බවත් එතුමා වැඩි දුරටත් පැවසීය.

ගරු උපසභාපතිතුමා පැවසූයේ එතුමාගේ යෝජනාවට අදාළ කාරණය නිවැරදි බවත්, ගරු හිටපු සභාපති වසන්ත ගුණරත්න මැතිතුමාගේ කාලයේ මන්ත්‍රීවරයෙක් ලෙස වැඩ කළ බවත්, එතුමාගේ කාලයේ වැඩිම ආදායම ලබා ගත්තේ ගලි ආදායම බවත්, එහිදී දිනකට වාර 19 පවා ඇද ඇති බවත්,නමුත් මෙහි ඩ්‍රයි බෙඩ් එකේ දාන්න පුළුවන් 05ක් පමණක් යනුවෙන් මතයක් හදාගෙන තිබෙන බවත්,නමුත් එහෙම දෙයක් නැති බවත් අනිවාර්යෙන් දිනකට නොමිලේ සේවා දෙකක් යන බැවින් වාර තුනක් පිටින් ලබා ගන්නා බවත්, එය තවදුරටත් වර්ධනය කළ යුතු බවත්ය. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා පැවසූයේ දැනට මෙම සභාවේ ගලිය ගන්නවට වඩා ඕපනායක ගලිය මෙහේ ගෙන්වන එක ලාභ බවත් මෙහි ගාස්තුව වැඩි බවත්, ඒ අනුව අප සැහෙන බරක් ජනතාව වෙත දමා ඇති බවත්, ඒ සම්බන්ධවද අවධානය යොමු කරන ලෙසත්ය.

මෙහිදී ගරු උප සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්. බී බණ්ඩාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහා සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී. අනතුරුව ගරු උප සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්විය.

**ඒ අනුව විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:10:02** කසළ අංගනයෙහි කටයුතු අධීක්ෂණය සහ කළමණාකරණය සඳහා මන්ත්‍රීවරු සහ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පත් කිරීම සඳහා යෝජනා කරමි.

ඉහත සඳහන් ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා සඳහන් කළේ සෞඛ්‍ය කාරක සභාව මෙම වසරටම ලබා නොගත් බවත් කොම්පෝස්ට් අංගනයේ කටයුතුවලට අදාලව මන්ත්‍රී වරුන්ගෙන් සහ විද්වතුන්ගෙන් සමන්විත අධීක්ෂණ කමිටුවක් පත් කිරීම සුදුසු බවත්, මෙහි භූගත ජලය අපිරිසිදු වන බැවින් ඉහත කමිටුව මගින් එම අදාල තාක්ෂණික කරුණු නිර්දේශ කර ගත හැකි බැවින් ඒ අනුව මෙය වෙනත් තැනකට මාරු කරන්නේ නම් එයද කළ යුතු බවත්, ඊළඟ පියවර ගත යුතු බවත් නැතහොත් නුදුරු අනාගතයේම මෙය නාය ගියහොත් විශාල ගැටලුවකට මුහුණ දීමට සිදුවනු ඇති බවත්, වළවේ ගඟෙන් ජනතාව ජලය ලබා ගන්නා බැවින් ඒ පිළිබඳව ද අවධානය යොමු කරන ලෙස ඉල්ලීම් කරන බවත්ය.

ගරු උප සභාපතිතුමා ,ඉහත මන්ත්‍රීතුමාගේ කතාව නිවැරදි බවත් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද්දේ වසන්ත ගුණරත්න මැතිතුමා සිටින කාලයේ බවත් මේ සඳහා වගකීම ලබා දුන්නේ වසර 20කට වැනි කාලයකට බවත්, බළන්ගොඩ නගර සභාවට ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පවතින්නේ විශාල චිත්‍රයක් බැවින් නමුත් දැන් එහි කාලය හරි බවත්, එහි ධාරිතාව ඉක්මවා ගොස් නැති බවත්, මෙය ස්ථානය වෙනත් තැනකට මාරු කිරීම ඉතා පහසුවෙන් කළ යුතු කාරණාවක් නොවන බවත්, හැකි ඉක්මනින් සෞඛ්‍ය කාරක සභාව රැස්කර ඉහත යෝජනාව පිළිබඳව සාකච්ඡා කරන ලෙසත්ය.

## 08. කාරක සභා වාර්තා සලකා බැලීම

2026.04.07,2026.04.22,සහ 2026.04.30 යන දිනයන්හි පැවති මුදල් කාරක සභා වාර්තා මෙදින ගරු සභාවට ඉදිරිපත් කළ අතර විරෝධතා නොවූ හෙයින් එකී වාර්තා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 09. ආදායම් වියදම් වාර්තා සලකා බැලීම

ප.ව.1.40ට පමණ ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා සභාවෙන් පිටවන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා සඳහන් කළේ පසුගිය සභා වාරයේදී ප්‍රචාරක දැන්වීම් පුවරු ආදායම ඉදිරිපත් කරන ලෙස දැන්වූවද න්‍යාය පත්‍රය සමග එය ඉදිරිපත් කර නොතිබූ බවත්, මාලිමා රජය මගින් ඔරලෝසු කණුව ළඟ මැයි දිනයට ප්‍රචාරක පුවරු සවිකර තිබූ බවත් එහි ආදායම කොපමණද යන්න දැනගත යුතු බවත්ය. තවද එතුමා වැඩිදුරටත් පැවසුයේ කරුණු රාශියක් කතා කිරීමට ඇති බවත් මෙහෙට චේන්සෝ එකක් ලැබී ඇත්තේ ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් බවත්, නමුත් දැන් ඒ හදන්න ගත්ත පුද්ගලයාට සල්ලි දීල නැති නිසා අරන් ගිහින් කියලා ආරංචිය පවතින බවත්, චේන්සෝ එක පිළිබඳව සොයා බලන ලෙසත්ය.

එමෙන්ම 03/22 වැනි දින නිවාඩු දිනයේකදී 1906 දරණ වාහනය මහජන පොලේ නඩත්තු කරන්න මිනිස්සු අරන් ගිහින් තිබෙන බවත්, එදින මෙම වාහනය කිලෝමීටර් දෙකක් පමණක් ධාවනය කර ඇති බවත්, නිවාඩු දවසක් තෝරාගෙන අතිකාල ලබා ගැනීම සඳහා මෙසේ ධාවනය කරන්න කම්කරුවන් රැගෙන ගොස් ඇති බවත්, මුදල් නාස්තිය සිදුවන්නේ කොතනින්ද කියන දේ පිළිබඳව සිතා බලන ලෙසත්, මෙම තොරතුරු පිළිබඳව සොයා බලා මෙම විනාශය නවත්වන ලෙසත් පැවසූ එතුමා එසේම මෙම සභාවේ සභාවට ආදරය කරන මිනිස්සු සිටින බවත් එම අයට මෙම විනාශය බලාගෙන ඉන්න බැරි තැන තමන්ට කියන බවත්, අරිෂ්ඨ බෝතලේ පොටෝ එකක් සම්බන්ධ සිද්ධියේදී ජීවිතයට අරිෂ්ඨ බෝතල් ගණන් බොනවා දැකල නැති බව පැවසීය.

එමෙන්ම තමන්ට මෙහෙ ඇවිත් තාක්ෂණික විසඳුම් දෙන්නවත් බෙහෙත් දෙන්නවත් බැරි බවත්, නමුත් මෙහි ඇති ගැටලු පෙන්වා දීමේදී ඇවිත් කෑ ගහලා යනවා කියන බවත්, තොරතුරු ලබා දෙන්නේ කවුද කියන එක නොව මේවා ඇත්තද කියලා හොයලා විසඳුම් ලබා දෙන ලෙසත්, ඒ විතරක් නොව මෙම 04/07 වැනිදා පාන්දර 1.10ට තෙල් බාන බවත්, ඒ වෙලාවට cctv වැඩ කරන්නෙත් නැති බවත්, බැටරි තුනක්ද නැති වී ඇති බවත්, පිටින් ඇවිත් මේවා නොකරන බවත්, මේවා මේ විදියට වෙනවා නම් සභාවේ පරිපාලනය කොතනද තියෙන්නේ කියන එක පිළිබඳව සිතන ලෙසත්, පත්වෙලා අවුරුද්දක් වුවද මිනිසුන්ට මොනවද කරේ කියලා හිතන්න ඕනි යන්නත්, ලයිට් එකක් දාලා තිබුණා එයට ස්තුතිවන්ත වන බවත්, වැඩ කරන බවත් නමුත් මේ තැන් මේ විදියටම තියෙනවනම් සභිකයන් පත් වී වැඩක් නැති බවත්, නිලධාරීන්ටම මේ විදියට කරන්න තිබූ බවත් එතුමා පැවසීය.

හොඳම දෙය වන්නේ කොම්පෝස්ට් එකේ පාඩු ලබන තත්ත්වයට පත්වෙලා තියෙන බවත්, එහි අලුත් වැඩක් සිදුවන බවත් ආදායම නැති නිසා කසිප්පු පෙරන බවත්, නගර සභාවේ ආදායම අඩු නිසා කසිප්පු පෙරන බවත්, ලැජ්ජයි යන්නත්, මේක මෙලෝ රහක් නෑ ජිල් බෝල හොද්ද වගේ යන්නත් පැවසූ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා මේ සම්බන්ධව නිසි ක්‍රියාමාර්ග ගෙන නිසි වැඩපිළිවෙළක් ක්‍රියාත්මක නොකරන්නේ නම් අපිත් දඩ ගහන දවස වැඩි ඈතක නොවන බවත් තරයේ ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපතිතුමා පැවසුවේ කස්ප්පු පෙරනවා යයි ලැබුණ තොරතුරට සභාපතිතුමා ඇතුළු කණ්ඩායමක් එහි ගිය බවත්, එවෙලේම පොලීසියට පැමිණිලි කළ බවත් පොලිසිය මුරකරුගෙන් ප්‍රකාශ ලබා ගත් බවත් කසිප්පු පෙරපු කෙනෙකු නොමැති බවත්, එහි ගොස් කසිප්පු අල්ලා ගත් බවත්ය. මෙහිදී ගරු උපසභාපතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා කසිප්පු පෙරන බවට පැවසූ චෝදනාව පිළිබඳව උස් හඬින් දෙදෙනාම එකවර කතා කිරීම හේතුවෙන් සභාවේ සෝෂාවක් ඇති විය.

අනතුරුව ගරු උපසභාපතිතුමා පැවසුවේ මේ සම්බන්ධව පරීක්ෂණයක් ක්‍රියාත්මක වන බැවින් පසුව පරීක්ෂණ වාර්තාව බැලිය හැකි බවයි.ගරු නාගරික මන්ත්‍රී කේ.ජී පේමදාස මැතිතුමන් සඳහන් කළේ මේ සඳහා අභ්‍යන්තර විමර්ශනයක් සිදුකර මෙයට සම්බන්ධ අයගේ සේවය තාවකාලිකව හෝ අත්හිටුවා නිසි ක්‍රියාමාර්ග ලබා ගන්නා ලෙසයි.ගරු උපසභාපති තුමා පැවසුවේ දැනටමත් සභාවෙන් අදාළ සේවකයන් සම්බන්ධව පරීක්ෂණයක් ක්‍රියාත්මක වන බැවින් ඒ අනුව එහි තොරතුරු ඉදිරියේදී දැනුවත් කරන බවයි. එසේම හර්ෂණ මන්ත්‍රීතුමා මතු කළ බෙහෙත් බෝතලයේ ප්‍රශ්නය පසුපස ගිය බවත් ඒ අනුව ආයුර්වේද වෛද්‍ය තුමිය පෙර පාසලේ දරුවන්ගේ වැඩසටහනක් වෙනුවෙන් එම ඖෂධ රැගෙන ආ බව පැවසූ බව එතුමා සඳහන් කළේය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්.එම්.බී බණ්ඩාර මැතිතුමා සඳහන් කළේ නගර සභාවේ කසිප්පු පෙරුවා කියන වචනය ඉල්ලා අස්කර ගන්නා ලෙසත්, එය වැරදි චෝදනාවක් බවත්, පුද්ගලයකුට එය කළ හැකි බවත් නමුත් එය සභාවේ මන්ත්‍රීතුමන්ලා නිලධාරීන් දැනුවත්ව කරන වැඩක් බවට අර්ථකථනය කිරීම වැරදී බවත්, මෙය මීඩියාවල යන්න ඕනෙද කියා තමන් නොදන්නා බවත්, ඒ අනුව එම වචනය වැරදියි ඉල්ලා අස්කර ගන්නා ලෙස හර්ෂණ මන්ත්‍රීතුමාට යෝජනා කරන බවත් මෙය සභාවේ 16දෙනාටම ඒ බලපානු ලබන බවත්ය. ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා මෙම අවස්ථාවේදී එම වචනය ඉල්ලා අස්කර ගන්නා බවත් ඒ අනුව සභාවේ කොම්පෝස්ට් එකේ කසීපු පෙරලා නෑ යන්නත් පවසන ලදී.

මෙහිදී ගරු උපසභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් වූ අතර මීට අදාළව පරීක්ෂණ කටයුතු සිදුකිරීම සම්බන්ධව ලේකම්තුමියට උපදෙස් දීමෙන් අනතුරුව ගරු උප සභාපතිතුමාගේ යෝජනාවෙන් සහ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී වසන්ත කුමාර මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**2026 මාර්තු මස ආදායම් වියදම් වාර්තාව**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | රු.16,017,998.35 |
| මූලධන ලැබීම් | රු.4,035,422.66 |
| වෙනත් ලැබීම් | රු.2,925,778.17 |
| මුළු ලැබීම් | රු.22,979,199.18 |
| පුනරාවර්තන වියදම් | රු.17,499,437.62 |
| ප්‍රාග්ධන වියදම් | රු.797,019.14 |
| වෙනත් වියදම් | රු.7,346,615.04 |
| මුළු වියදම් | රු.25,643,071.80 |

**2026 අප්‍රේල් මස ඉන්ධන වාර්තාව**

| **2026 අප්‍රේල් ඉන්ධන වාර්තාව** | |
|---|---|
| වාහන අංකය | මුදල (රු) |
| 226-7521 | 31655.91 |
| 227-5020 | 134677.10 |
| 56-1906 | 30472.90 |
| BC 0005 | 76070.00 |
| GC 0001 | 21798.00 |
| GK 1483 | 110134.16 |
| JD 4684 | 1990.00 |
| ND 5124 | 22549.46 |
| LL 2110 | 16219.72 |
| HF 7899 | 49452.00 |
| ZA 5039 | 32470.00 |
| U TON ROLLER | 6060.00 |

| | |
|---|---|
| LL 7688 | 26000.83 |
| PF 4006 | 45841.91 |
| RC 1107 | 48960.00 |
| RC 1118 | 45764.36 |
| RD 8000 | 35911.44 |
| RD 8240 | 93975.44 |
| DDR 0008 | 2424.00 |
| ZA 9835 | 56918.76 |
| QL 2901 | 8626.25 |
| RC 1183 | 83286.67 |
| ZA 0228 | 19499.95 |
| **TOTAL** | **1,000,758.86** |

මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 10. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්

**ගරු නාගරික මන්ත්‍රී කේ.ජී ජේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී ජේමදාස මැතිතුමා තම අදහස් දක්වමින්, නගරයේ පවත්නා සතොස ගොඩනැගිල්ල කඩා වැටීමට ඉතා ආසන්න බවත්, එසේ සිදුවුවහොත් දැඩි අලාභ හානියක් සිදුවන බවත්, එය සභාවට මෙන්ම මාලිමා රජයටද හොඳ නැති බවත්, එහි සභාපතිතුමා පවා දැනුවත් කළ බවත්, නගරයේ පවත්නා අනෙක් සතොස ශාඛාව පවත්වාගෙන යනු ලබන්නේ

විශාල මුදලක් ගෙවීමෙන් බවත්, ගොඩනැගිල්ල ඔවුන් හදන්නේ නැතිනම් මේ පිළිබඳව සාකච්ඡා කර මැදිහත් වී විසදිය යුතු බවත්, නගරයට විශාල හානියක් වගේම නගරයේ අලංකරණයටද මෙය බලපාන බැවින් මැදිහත්වී ගැටලුව විසඳන ලෙස උපසභාපතිතුමාට දන්වමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු උපසභාපතිතුමා මෙහිදී පැවසුයේ මෙහි ඇති භයානක තත්ත්වය වන්නේ විශාල විදුලි කාන්දුවක් පැවතීම බවයි. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී ප්‍රේමදාස මැතිතුමා පැවසුවේ වෙළඳ අමාත්‍යතුමා සමඟ හෝ සාකච්ඡා කර මේ සඳහා අවධානය යොමු කළ කඩිනම් පිළියම් යෙදිය යුතු බවයි.

**ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ. එස් චන්දන මැතිතුමා පැවසුයේ දත්තයක් ලබාදීමේදී එය ක්‍රමානුකූලව ලබාදිය යුතු බවත් 04/07 දිනැති මාසික සභා වාර්තාවේ විනෝද බදු මුදල් ආදායම ලෙස රුපියල් 50000ක් ලෙස දක්වා ඇති බවත්, ආදායම් වියදම් වාර්තාව අනුව එහි අගය රුපියල් 10250.00ක් බවත්, ඒ අනුව දත්තයක් ලබාදීමේදී එය නියමානුකූලව ලබා දෙන ලෙසයි.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා තම අදහස් දක්වමින් පසුගිය මස සහ මෙම සභාවේ ඇති වාර්තා පෙන්වමින් ඒවායෙන් සතපහක වැඩක් නැති බවත්, ඒවාට වැය කරන මුදල් අපරාධයක් බවත්, අපරාධ දූෂණය නැති කරනවා කියලා ආපු අය දැන් ඒවා කරන්නේ නැති බවත්, වියදම තිබුණාටත් වඩා වැඩි වී ඇති බවත්, වැඩක් කරන්නෙත් නැහැ අපට වැඩකුත් නැහැ යන්නත්, නිලධාරීන් මෙම වාර්තා සැදීමට විශාල මහන්සියක් ගන්නා බවත් මේවායේ වියදම අඩුකර වට්ස්ඇප් කරලා හෝ වියදම අඩු කරන ලෙසත්ය.

එසේම අද දින සුළු කාලයකට හෝ මූලාසනයේ වැඩි බැලීම් සම්බන්ධව සතුටු වන බවත් එකවරම සභාවක් මෙලෙස භාරගැනීමේදී එය එකවරම කරගැනීමට අමාරු නමුත් උපසභාපතිතුමා ඒ කළ විනාඩි 45 තුළ සභාව ඉතා සාර්ථකව මෙහෙයවීම සම්බන්ධව සතුටු වන බවත්, පෙර සභාවන්වල තමන් ඇතුළු දේශපාලන කණ්ඩායම් සමග සිටීමේ ආභාෂය තිබෙන බවත්, තවත් කාරණාවක් ලෙස සභාවේ 100% සුක්කානම ගත යුත්තේ සභාපතිවරයා බවත් එසේ නොමැතිව මෙය ගෙන යා නොහැකි බවත් හර්ෂණ මන්ත්‍රීතුමා යම් වචනයක් ප්‍රකාශ කළ බවත්, එතුමන්ලාද යම් දේශපාලන මතයක් නියෝජනය කරන බවත්, මෙහි සියඔලා පොඩ්ඩක්

හෝ ගෙනවිත් තියෙනවානේ යන්නත්, නැත්තේම නැති බවත්, එතුමා පැවසිය යුතු දේ එම අවස්ථාවේදී පැවසිය යුතු බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා තම අදහස් දක්වමින් පැවසුවේ ඉන්ධන වාර්තාවේ එම වාහනය ධාවනය කරනු ලබන කිලෝමීටර ගණන දැක්වූයේ නම් එය වඩාත් ප්‍රායෝගික වන බවයි.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා තම අදහස් දක්වමින් 2010 වර්ෂයේ සිටම බළන්ගොඩ නගර සභාවේ සේවය කළ ඉරේෂ් හෙට්ටිආරච්චි නිලධාරි මහතා අද දින සේවයෙන් ඉල්ලා අස්වන බවත්, එතුමා දක්ෂ නිලධාරී මහතෙකු බවත්, දක්ෂ වොලිබෝල් ක්‍රීඩකයෙකු එමෙන්ම ඕනෑම රාජකාරියක් බාර දුන්නොත් එය හොඳින් ඉටුකරන දක්ෂ නිලධාරියකු බවත්, වරිපනම් විෂයේ ඉතා දක්ෂ ලෙස ආදායම් එකතු කළ නිලධාරියකු බවත්, ඒ පිළිබඳව හරි දුකයි වේදනාවක් පවතින බවත්, හෘද සාක්ෂිය අනුව ඉතා පිරිසුදුව රාජකාරිය කරන ලද චෝදනා නොමැති අවංක නිලධාරී මහතෙකු බවත්, එතුමා කොහේ ගියත් එතුමාට දෙවියන්ගේ ආශිර්වාදය ලැබේවා කියා ප්‍රාර්ථනා කරන බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය තම අදහස් දක්වමින් ඉහත සිද්ධිය ඉතා සංවේදී කාරණාවක් බවත්, ඒ පිළිබඳව කණගාටු වන බවත්, එවැනි දක්ෂ නිලධාරින් මේවායින් ඉවත් වෙනවා කියන්නේ මේවා තව තවත් කඩා වැටෙන බවත් ,වසරක් ගත වුවද සුසාන භූමියේ ගැටලුව තවමත් ඉටු වී නොමැති බවත්, මෙම වර්ෂය අවසන් වීමට පෙරවත් මේ සම්බන්ධව ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් එහි පවතින කැඩුණු ස්මාරක ඉවත් කරගන්නා ලෙස අදාළ පාර්ශවයන් වෙත දැනුම් දෙන ලෙසත්ය.

ගරු උපසභාපතිතුමා පැවසුවේ රාජ්‍ය ආයතනයක් ලෙස රාජ්‍ය දේපළවල පවතින ගස් කපා බිම හැලීම සිදුකළ නොහැකි බවත්, සුසාන භූමි ආඥා පනත අනුව ස්මාරක සම්බන්ධයෙන් කටයුතු කළ යුතු බවත් ඒ අනුව ක්‍රියාත්මක වන බවත්ය.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමි මැතිතුමා නැවතත් අදහස් දක්වමින් සභාපති කෙනෙක් සභාපති පුටුවේ වාඩි වෙනකොට ඇහුම්කන්දී හරියට පිළිතුරු ලබා දීම අවශ්‍ය බවත් සිදුවිය යුත්තේ එය බවත්, සභාවේ සැම දිනකම සැම මන්ත්‍රී කෙනෙක්ම අවසානයේ සභාව පිළිබඳ දෝෂාරෝපණය කරන බැවින් ඊළඟ සභා වාරයේදී හෝ සභාවේ හොඳ දෙයක් කියන්න ලැබේවා යන්න ප්‍රාර්ථනා කරන බවත් ,එසේම සභාපති පුටුවේ වැඩ බලන නොව ස්ථිර සභාපති වශයෙන් වාඩිවීමට උපසභාපතිතුමාට හැකි වේවා යන්න ප්‍රාර්ථනා කරන බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**11. අවසානය**

ගරු උපසභාපතිතුමා අදහස් දක්වමින් කෙටි වේලාවක් මූලාසනයේ කටයුතු කිරීමට අවස්ථාව ලබාදුන් සභාපතිතුමාට ස්තුතිවන්ත වන අතර මේ සඳහා සහයෝගය ලබා දුන් සියලු දෙනාට ස්තුතිවන්ත වන බවත්, එසේම හෙට්ටිආරච්චි නිලධාරි මහතාගේ සේවයෙන් ඉවත්වීම පිළිබඳව දැනගන්නට ලැබුණේ මෙම අවස්ථාවේදී බවත්, එතුමා නගර සභාවට විශාල සම්පතක් බවත්, පැවරු රාජකාරිය ඉතාමත් හොඳින් ඉටුකල අවංක නිලධාරියෙකු බවත්, මෙය එතුමාගේ පෞද්ගලික තීරණයක් විය යුතු බවත්, එතුමාගේ ඉදිරි අනාගතයේ කටයුතු සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවා යන්නත් පවසන ලදී.අනතුරුව අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය, කාර්ය මණ්ඩලය සහ මාධ්‍යවේදී කණ්ඩායම සඳහා ස්තුතිය පුද කරන බව දන්වමින් මෙදින මහ සභාවේ කටයුතු ප.ව.03.16 ට පමණ අවසන් කරන ලදි.

එන්.ඩබ්.පී.ටී ජයසේන,

සභාපති,

බළන්ගොඩ නගර සභාව.